# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2561 වෙසක් මස 10 වන බුධ දින ■ 2017 මැයි මස 10 වැනි බදාදා




■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ

# අති උතුම් වෙසක් පොහොය දිනයේ වැදගත්කම

- බෝධිසත්වයන් වහන්සේගේ උපත, බුද්ධත්වයට පත්වීම හා පිරිනිවන් පෑම.
- තෙවැනි වරට බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩම කිරීම.
- එම ගමනේදී සිරිපා සටහට තැබීම.
- විජය කුමරු ඇතුළු 700 ක් සෙනඟ මෙරටට පමිණීම.
- දේවානම්පිය තිස්ස රජතුමා දෙවන වරටත් අභිෂේක ලැබීම.
- දුටුගැමුණු රජතුමා රුවන්වැලි මහසෑයේ වැඩ ආරම්භ කිරීම.
- බුදු රජුන් කිඹුල්වත් නුවරදී සුදොවුන් රජු ඇතුළු නෑදෑ පිරිස ඉදිරියේ යමාමහ පෙළහර පැවැත්වීම.
- සිරිපා වන්දනාවේ යෙදෙන අවසාන පෝය දිනය වීම.



## ජාතික වෙසක් සතිය මැයි 07 සිට 13 දක්වා

සම්බුදු තෙමඟුල සිහි කරමින් වෙසක් මහෝත්සවය මුල් කරගෙන මෙම වර්ෂයේ වෙසක් සතිය මැයි මස 7-13 දක්වා පැවැත්වේ. මෙවර රාජ්‍ය වෙසක් උත්සවය 9 හා 10 යන දිනයන් තුළ කෑගල්ල දිස්ත්‍රික්කයේ වට්ටාරාම විහාරස්ථානයේදී පැවැත්වීමට කටයුතු යොදා තිබේ.



බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් නිමල් කොටවෙලගෙදර මහතා, සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති ආචාර්ය වැලමිටියාවේ ශ්‍රී කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ හා සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී පූජ්‍ය ගෝනදූවේ ගුණානන්ද නායක ස්වාමීන් වහන්සේගේ අත්සනින් යුතුව වෙසක් සතිය නිමිත්තෙන් ක්‍රියාත්මක කළ යුතු ජාතික වැඩසටහන් පිළිබඳව දිවයිනේ සියලුම විහාරස්ථාන වෙත දන්වා තිබේ.

සෑම විහාරස්ථානයකටම ප්‍රවිශ්ට වන දොරටුව අබියස 'ධම්ම චාරි සුඛං සෙති' (දැහැමි දිවිය සැපත සදයි) වැකිය සඳහන් ළා කහ පැහැති බැනරයක් යොදාගන්නා ලෙස දක්වා ඇති අතර එහි ශ්‍රී බුද්ධ 2561 වශයෙන් සඳහන් කර වර්ෂ 2017 මැයි 7 සිට 13 දක්වා වෙසක් සතිය යනුවෙන් සඳහන් කිරීමට උපදෙස් ලබාදී තිබේ.

මැයි මස 7, 8, 9, 10 යන දිනයන්හිදී බුදු දහම හා පරිසරය පිළිබඳ දේශනා, වැඩමුළු, ශ්‍රමදාන, බුදුදහම හා සෞඛ්‍ය වෛද්‍ය සායන, ලේ දන් දීම්, අක්ෂි සායන, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, සාහිත්‍යය හා බුදු දහම් දේශන, සාකච්ඡා, සම්මන්ත්‍රණ, සීල සමාදාන වැඩසටහන් මෙදින පෝය දින බැවින් කිසිදු සැනකෙළියක් පැවැත්වීම නොකළ යුතු බව ලිපියේ සඳහන්ය.

මැයි මස 11 සිට 13 දක්වා කලාව හා බුදු දහම සදහම් චාරිකා වැඩ සටහන්, රාජ්‍ය සේවය හා බුදු දහම සම්මන්ත්‍රණ වැඩමුළු, සමාජ සංවර්ධනය, ආර්ථිකය හා බුදු දහම සම්බන්ධ ප්‍රායෝගික වැඩ සටහන් පැවැත්වීමට වැඩිදුරටත් උපදෙස් දී තිබේ.

''මේ ලෝකයේ කවරදවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''



# එක්සත් ජාතීන් ලංකාවේදී සමරන වෙසක් තෙමඟුල

United Nations Day of
VESAK
2561 B.E./2017 SRI LANKA

**ශ්‍රී ලාංකික** බෞද්ධයන් වූ අපි මෙවර බුදු තෙමඟුල සමරනු ලබන්නේ කිසියම් ජාතික අභිමානයකින් යුතුවය. ඊට ප්‍රධාන හේතුව මෙවර වෙසක් උළෙල එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වය ඇතිව ශ්‍රී ලංකාද්වීපයේ පැවැත්වෙන බැවිනි. ලෝකයේ තවත් ප්‍රධාන ධාරාවේ බෞද්ධ රටවල් තිබියදීත් ඒ සඳහා අපේ මේ පුංචි දිවයින එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තෝරා ගැනීමෙන් පෙනී යන්නේ නිර්මල ථෙරවාදී බුදු දහම පවතින ශ්‍රී ලංකාව කෙරෙහි එම සංවිධානය දක්වන ලද ගෞරවය කෙතරම් ඉහළද යන්නයි. මෙවර වෙසක් පුන් පොහෝ දින පැවැත්වෙන ජගත් වෙසක් පුණ්‍යෝත්සවයේ සමාරම්භක උළෙල පැවැත්වෙන්නේ ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතාගේ ප්‍රධානත්වයෙනි. සමාප්ති උළෙල සඳහා නේපාල ජනාධිපතිනී බිද්‍යා දේවි භන්ඩාරි මැතිනිය සහභාගි වීමට නියමිතය. එය මහනුවර ශ්‍රී දළදා මැදුර අභියසදී පැවැත්වේ.

මෙම මැයි මස 12, 13 සහ 14 යන දිනයන්හි අති උත්සවාකාරයෙන් හා බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව කොළඹදී පැවැත්වෙන මෙවර වෙසක් උළෙල සඳහා ලෝකයේ රටවල් 80 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි වීම විශේෂත්වයකි. එම රටවල රාජ්‍ය නායකයන් මෙම අති උතුම් වෙසක් දිනවල ශ්‍රී ලංකාවට සැපත්වීම ඔවුන් අප රටට දක්වන දයාව හා ගෞරවය මූර්තිමත් කරවන්නක් බව කිව යුතුමය. බුදුරජාණන් වහන්සේ විසින් පාදා දෙන ලද උතුම් ශ්‍රී සද්ධර්මය ගැන මෙහිදී විශේෂ කතිකාවක් සිදුකරනු ලබන අතර එම අවස්ථාවන්ට අපේ ගරුතර මහා සංඝරත්නය, ජනපතිතුමා, අගමැතිතුමා ඇතුළු මැති ඇමැතිවරුන්ද සහභාගි වෙති.

ජාත්‍යන්තර වෙසක් උත්සවයට සමගාමීව පිළියන්දල නගරය ආසන්නයේ ඉදිකොට ඇති ශාක්‍ය ජනපදයේ සුද්ධෝදන මාලිගාව හා ලුම්බිනි උයනද වෙසක් උත්සව සමයේ විවෘත කිරීමද බෞද්ධ ජනතාවගේ සිතේ සතුට හා බුදු බැතිය දනවන සුවිශේෂී කරුණකි. ''ලෝක තිරසර සාමය සඳහා බුදු දහම උගනිමු'' යන්න මෙවර ජගත් වෙසක් මහෝත්සවයේ තේමා පාඨයයි.









''යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ.''

# එදා සිදුහත් තරුණය නොකළා නම් අනෝමා ගංතෙර



සිද්ධාර්ථ බෝධිසත්ව චරිතය තුළ දිස්වන අසාමාන්‍ය සිදුවීම ලෙස මහාභිනිෂ්ක්‍රමණය හැඳින්විය හැකිය. එකම බර සසර බර ලෙසත්, එකම දුක සසර දුක ලෙසත් දුටු බෝධිසත්වයෝ ජාති, ජරා, ව්‍යාධි, මරණ යන දුක්ඛ දෝමනස්සයන් යථාර්ථවාදීව දැක ගිහි ගෙදරින් නික්ම සංසාර දුක නිවාරණ මාර්ගය සොයා යන මාවතට ප්‍රවිශ්ට වීමට සිතා ගත්තේය. මහාභිනිෂ්ක්‍රමණයේ සිට සම්බුද්ධත්වය අවබෝධ කරගැනීම දක්වා තොරතුරු අධ්‍යයනය කිරීමේදී මජ්ඣිම නිකායේ අරියපරියේෂණ සූත්‍රයත්, මහාවග්ග පාලි මහා වර්ගයත් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

බෝසත්වරු අභිනිෂ්ක්‍රමණය කරන්නේ ආර්ය පර්යේෂණ පිණිසය. ජාති, ජරා, මරණ ආදියෙන් එතෙර වනු පිණිස උපයෝගී වන කෙලෙස් දවාලන මාර්ගය සෙවීම ආර්ය පර්යේෂණයයි. මේ සම්බන්ධයෙන් විමසීමේදී සතර පෙර නිමිති පිළිබඳ සංකල්පනාව මුල් බැසගෙන ඇත.

මහල්ලෙක්, ලෙඩෙක්, මළසිරුරක් සහ පැවිදි රුවක් යනු සතර පෙර නිමිති ලෙස සැලකේ. බෞද්ධ චිත්‍ර ශිල්පියා සිද්ධාර්ථ කුමරුගේ අභිප්‍රාය වූ ජාති, ජරා, මරණවලින් නිදහස්වීමේ සුවය මෙසේ සතර පෙර නිමිති ලෙස සිතුවමට නැංවූ බව කල්පනා කළ හැකිය. මහා අභිනිෂ්ක්‍රමණය පිළිබඳව මජ්ඣිම නිකායේ අරිය පර්යේෂණ සූත්‍රයේ සඳහන් වන්නේ පහත සඳහන් පාඨයේ මේ පිළිබඳ කදිම විවරණයක් සපයයි.

"මහණෙනි, මමත් බුදුවීමට පෙර බෝධිසත්ව කාලයේ ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක පරිදේවයන් පිළිබඳ සොයා බැලීමි. ඒ මම පසුව නව භද්‍ර යෞවනයේම කලු කෙස් ඇති සොඳුරු යෞවනයෙක් යුතු පළමු වයසේදීම මව්පියන් අකමැත්තෙන් කඳුළු පිරි මුහුණින් හඬද්දීම කෙස්, රැවුල් කපා කසාවත් හැඳ, ගිහි ගෙයින් නික්ම පැවිදි වූ මම කුසලය කුමක්දැයි සොයමින්" කටයුතු කළ බව සඳහන් වේ.

එකල ඉතාම නැණවත්, කාලීන වශයෙන් ජනප්‍රිය වූ ආචාර්යවරු වූවෝ ආලාර කාලාම, උද්දකරාම යන අය වූහ. නේරංජනා ගංගා තීරයේදී සාම්ප්‍රදායිකව තාපස වේසය දරනු පිණිස, කේශච්ඡේදනය කර කසාවත් පොරවා ගත් සිද්ධාර්ථ තාපසයා රජගහනුවර බිම්බිසාර රජදරුවන් වෙසෙන එනුවරද සංචාරය කර ඒ මග ඔස්සේ ආලාර කාලාම වැනි ධ්‍යානලාභී මුනිවරු සොයා ගොස් ඒ අයගේ දහම, දර්ශනය මැනවින් අධ්‍යයනය කර එහි යථා තත්ත්වය අවබෝධ කරගත්හ. තමන්ගේ මූලික ඉලක්කය සංසාර ගමන නතර කරන, සියලු කෙලෙස් මල දුරලන මාවතක් බව දැන සිටි සිද්ධාර්ථයෝ ඔවුන්ගෙන් නික්ම දැඩි දුෂ්කර ක්‍රියාවක නිරත වෙමින්, ශරීරයට දැඩි දුක් දෙන මාවත තුළින් විමුක්තිය සෙවූහ. පසුකාලීනව අත්තකිලමතානුයෝගය ලෙස පෙළ දහමේ සඳහන් වන්නේ එයයි.

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''


කෙතරම් ගැඹුරු ලෙස දුෂ්කර ක්‍රියාවේ නිරත වූවාද යත් එතුමා ආහාරපානාදියෙන් වැළකීම නිසා සිරුර අප්‍රාණික විය. පසුව මෙම කටුක ව්‍රතවලින් අර්ථයක් නොමැති බව වටහාගෙන තමන් සමීපයට වැටෙන කොල, ගෙඩි ආදිය වළඳමින් ශරීරයේ වෙහෙස නිවා ගත්තේය. මෙය පවත්තඵලභෝගී ජීවන රටාව ලෙස බුදු සිරිතේ දක්වේ. අවසානයේ දුෂ්කර ක්‍රියාව නිම කිරීමෙන් පසු පාරමී දම් බලයෙන් දැඩි අධිෂ්ඨාන සහගතව වජ්‍රාසනාරූඪ වූ සිදුහත් කුමරු බුද්ධත්වයට පත්වී මිස නොනැගටිමියි දැඩි අධිෂ්ඨානයක පිහිටියේය.

දිනක් අපූර්ව සිදුවීමක් විය. දැඩි වෙහෙසට පත්ව රාත්‍රියක නිද්‍රෝපගත වූ සිද්ධාර්ථ කුමරු අලුයම් කාලයේ සිහින පහක් දුටුවේය. එම සිහිනවල අර්ථය වූයේ තම අභිමතාර්ථ සාධනය සඵල වන බවයි. ඒවා මෙසේය.

1. මහපොළොව යහනාවක් වී හිමාලය පර්වතය කොට්ටයක් බවට පත්වීම. එහි අර්ථය බෝධිසත්වයෝ ආර්ය සත්‍ය ප්‍රත්‍යක්ෂ කරන බවයි.
2. කුමරුගේ නාභියෙන් රන් පැහැති ඊතණ පැළවී එය අහස් කුස සිසාරා පැතිරී යයි. එහි ඵලය නම් තමන් අවබෝධ කරගත් සත්‍යය ලෝවැසියාට හෙළි කරන බවයි.
3. කලු හිස් ඇති සුදු පාට පණුවෝ සිදුහත් කුමරුගේ දෙපා මුල සිට දණහිස දක්වා පැතිරේ. එයින් අර්ථවත් වන්නේ උපාසක, උපාසිකාදී ගිහි අනුගාමික පිරිස් විශාල සංඛ්‍යාවක් තම පිරිවර වන බවයි.
4. විවිධ වර්ණවත් ලිහිණියෝ සතර දෙනෙක් තම දෙපා මුල වැටී සුදු පාට වෙයි. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශූද්‍ර යන කුල සතරටම අයත් විශාල පිරිසක් තම ශ්‍රාවක බවට පත්වීම එයින් අපේක්ෂිතය.
5. විශාල අසූචි පර්වතයක එහි නොගැටී, නොඇලී බෝසත් ගමන් කරයි. එයින් අර්ථවත් වන්නේ ලාභයෙන් ගිජු නොවී මධ්‍යස්ථව ක්‍රියා කරන බවයි.

මෙම සිහිනයේ අර්ථය විමසීමෙන් පසු දිනක අසල ග්‍රාමයක සිටු දියණියක වූ සුජාතා දේවිය, කිරිපිඬු පූජාවක් සඳහා නේරංජනා ගඟ අසබඩට පැමිණි මොහොතේ බෝසත් රුව දැක තම අභිමතාර්ථය සාධනය වනු පිණිස අජපාල නුගරුක මුල වැඩ හුන් බෝසත් තෙමේ වෙත ක්ෂීරපායාසය පුදනු ලැබුවාය. පසුව නේරංජනා ගංගාවට පුද කළ කිරිපිඬු පාත්‍රය උඩුගං බලා යනු දැක බෝසත් තෙම තම අපේක්ෂාවේ යම් ප්‍රතිඵලදායක සුබ පෙරනිමිත්තක් දුටු බව කල්පනා කළේය. සුජාතා සිටු දියණියද සතුටු වූවාය.

සාර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරා පාරමී දම් පුරා පැමිණි මාවත ප්‍රඥා පාරමිතාවේ අග්‍ර ඵලය ලොවට දානය කිරීමට උදාවන අසිරිමත් මොහොත ළංවෙමින් තිබිණි. බෝධි මණ්ඩපයේ වැඩ හුන් සිද්ධාර්ථ තාපසයා දුක, දුකට හේතුව වන තෘෂ්ණාව, එයින් අත්මිදී ලබන නිවන් සැනසුම සහ හුදී ජනයා ගමන් කළ යුතු ආර්ය මාවත අනුස්මරණය කරද්දී අවිද්‍යාව නිසා සංස්කාර ධර්ම ඇතිවන අයුරුත් අවිද්‍යාව දුරලා දුක්ඛ නිරෝධය අවබෝධ කරගත හැකි අයුරුත් මෙනෙහි කළ සේක. ආශ්වාස, ප්‍රශ්වාස සම්බන්ධ කරගනිමින් හදවතේ ස්පර්ශය පාලනය වෙද්දී ආනාපානසති භාවනාව වඩා චිත්ත සමාධිය තරයේ වැළඳ ගත් සේක. එසැණින් සව් කෙළෙසුන් නැසීමෙන් ලැබෙන ආසවක්ඛය ඥානය පහළ වෙද්දී සත්වයාගේ චුති උත්පත්ති පිළිබඳ පිරිසිඳ දැනගන්නා චුතුප්පාද ඥානයද පහළ විය. බුද්ධ ආලෝකය අනුත්තර වේ. මෝහාන්ධකාරයේ නිමග්නව



සසර පුරා ඇවිදිමින් ගත කළ සත්වයාගේ සංසාර ගමන නිවාරණය කරන උතුම් සම්බුද්ධත්වය පසක් කරගැනීමට එදා වෛසාඛපූර්ණමී දිනයේ හැකිවූ සේක.
බුධ ස බෝධනේ ධාතුවෙන් නිපන් බුද්ධ ශබ්දයෙන් අර්ථවත් වන්නේ දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන චතුරාර්ය සත්‍යාවබෝධයයි. එබඳු ආර්ය සත්‍ය ධර්මයක් වෙනත් කිසිම ශාස්තෘවරයකුගේ ප්‍රඥාවට, අවබෝධයට විෂය වී නොමැත. සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂාවබෝධයේ අග්‍ර උදානය අරහං සම්මා සම්බුද්ධත්වයයි. උතුම් බුද්ධ රත්නයේ ආනුභාවයෙන් ලොවට ශාන්තිය උදාවේවා.

**පූජ්‍ය වජිර බුද්ධි හිමි**



# සිල් සමාදන් වීමට දිනයක්, වයසක් නැත

## මාරයා ළඟා වනුයේද දිනයක්, වයසක් නොබලාය

පංච ශීලය බෞද්ධයාගේ නිත්‍ය ශීලය බැවින් එය සමාදන් වීමට විශේෂ දිනයක් නැත. ''සිල් සමාදන් වන්නට යනවා'' යි කී විට අපේ සිතට නිතැතින්ම නැගෙන්නේ පොහෝ දින විහාරස්ථානයකට ගොස් අටසිල් සමාදන් වීම ගැනයි. සීලය නම් කය, වචනය යන ද්වාර දෙක සංවර කරගැනීමයි. කය ප්‍රධාන කරගෙන ප්‍රාණඝාතය, අදත්තාදානය හා කාමමිච්චාරය යන අකුසල් තුන සිදුවෙයි. වාග් ද්වාරය මුල් කොට ගෙන බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම හා දෙලොවටම ප්‍රයෝජනයක් නැති හිස් වචන කීම යන අකුසල කර්ම හතර සිදුවෙයි. සීල සමාදානයෙන් කෙරෙනුයේ ඉහත කී දොරටු දෙක සංවර කරගෙන ඒවායින් සිදුවන අකුසල කර්ම සතෙන් වැළකීමයි. මනස සංවර වීම සීලයෙන් නොසිදුවෙයි. පංච සීලය සමාදන් වූ තැනැත්තාට ප්‍රාණඝාතයක් කරන්නට සිතෙන්න පිළිවන. එහෙත් සමාදන් වී ඇති සීලය නිසා ඒ සිත ක්‍රියාත්මක නොකරයි. අනෙකුත් අකුසල කර්මයන්ද සීලය නිසා ක්‍රියාවට නොනැංවෙයි.

සිතෙහි පවතින ක්ලේශයන්හි අනුසය, පරියුට්ඨාන, ද්විතික්කම යැයි අවස්ථා තුනක් ඇත. අනුසය නම් සිතෙහි තැන්පත් වී පවතින, කොහේ පවතිනවාදැයි සිතන්නටවත් නොහැකි ලෝභාදී අකුසල ධර්මයන්ය. ගැටීමක් ඇතිවූ විගස එම ක්ලේශ ධර්ම නැගිටියි. පරියුට්ඨාන නමින් හැඳින්වූයේ එය නැගිටින අවස්ථාවයි. ගැටීම උත්සන්න වූ විට ක්‍රියාත්මක වෙයි. ද්විතික්කම නමින් හැඳින්වෙන්නේ ඒ ක්‍රියාත්මක වන අවස්ථාවයි. සීලයෙන් කෙරෙනුයේ ද්විතික්කම අවස්ථාව වළකාලීමයි. අනුසය, පරියුට්ඨාන අවස්ථා දෙක නැති කළ හැක්කේ භාවනාවෙන් පමණි. කය, වචනය දෙක සංවර කරගැනීමකින් තොරව භාවනාවක් කළ නොහැකිය. සීලය භාවනාවට පදනම යැයි කීවේ එහෙයිනි.



මනුෂ්‍ය ජීවිතයද බාල, තරුණ හා මහලු යැයි අවස්ථා තුනකට බෙදා දක්වා ඇත. තවදුරටත් ක්‍රීඩා දී දශකවලටද බෙදා තිබේ. ළදරුම අවස්ථාව හැර අනෙක් ඕනෑම අවස්ථාවක් සිල් සමාදන්වීමට යෝග්‍ය වන්නේය. ශාසනයේ පැවිදි බව ලබා මහ රහත් භාවයට පත් සමහර උතුමෝ සත් හැවිරිදි වූහ. මිනිසකුට වයස අවුරුදු හත වන විට යමක් කමක් සිතා කියා තීරණය කරගැනීමේ හැකියාව ඇතිවෙයි. එම නිසා සත් හැවිරිදි වියේ පටන්ම සිල් සමාදන් වීම ඉතා සුදුසුය. එවිට සිල් සමාදන් වීමේ ඇබ්බැහියක් කුඩා දරුවනට ඇතිවනු නිසැකය.

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දාම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

ධම්මපදයේ කතාවෙහි එන මහාකාල වස්තුවේදී මහාකාල පවසනුයේද තරුණ වයසේදීම සීලාදී ගුණ ධර්මයන්හි පැවැතිය යුතු බවයි.

"ජරා ජජ්ජරිතා හොන්ති
හත්ථ පාදා අනස්සවා
යත්ථ සෝ විහතත්ථාමො
කථං ධම්මං චරිස්සති"

ජරාවෙන් දුදුරු වී, අත් පා අවසඟ වී බලය පිරිහුණු කල්හි කෙසේ ධර්මයෙහි හැසිරෙන්නේදැයි ඔහු තම මළණුවන්ගෙන් ප්‍රශ්න කරයි. කරුණු මෙසේ වුවත් අද සමාජයේ බොහෝ දෙනා පුරුදු වී ඇත්තේ වයස්ගත වූ විට සිල් සමාදන්වීමටය. මේ හැඟීම බ්‍රාහ්මණ ධර්මයෙන් අපට ආවක්ද විය හැකිය. බ්‍රාහ්මණ වර්ණාශ්‍රම ධර්ම සකස් වී ඇත්තේ ඒ අයුරිනි.

"ශෛෂවේභ්‍යස්ථ විද්‍යානං
යෞවනේ විෂයෛෂිනාම්
වාර්ධකේ මුනිවෘත්තිනාම්
යෝගේනාන්තේ තනුජ්‍යජාම්"

ළදරු කාලයෙහි ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමත්, තරුණ වියෙහිදී කාම සම්පත් විඳිමින්, මහලු වියේදී මුනිවරයෙක් වශයෙන් ජීවිතය ගත කොට භාවනානුයෝගීව මිය පරලොව යාමත් බ්‍රාහ්මණ වර්ණාශ්‍රම ධර්ම වශයෙන් හැඳින්වේ. අපේ බෞද්ධයන් බොහෝ දෙනෙක්ද වයසට පත්වූ විට සිල් සමාදන් වීමට පුරුදු වී සිටිති. එසේ වීමට තවත් හේතුවක් නම් වියපත් වූ විට තමාගේ ආයු කාලය පිරිහී මරණයට ළඟා වී ඇති බව අවබෝධ වීමයි.

සමහරු වයස්ගතව සිල් සමාදන් වන්නවුන්ට කලකොලොප්පම්ද කරති. වයසට පත්වන විට ප්‍රාණඝාතාදිය කරන්නට අත පය වාරු නැති බැවින් ඉබේම සිල් රැකෙන බව ඔවුහු පවසති. එසේ වුවත් අවසාන භාගයෙහි හෝ සිල් සමාදන් වන්නේ නම් එය වැදගත් ක්‍රියාවකි. හේතුව? පරලොව සුබසිද්ධිය සලසා ගැනීමට එය මහඟු උපකාරයක් වන බැවිනි. බුදුරජාණන් වහන්සේද දේශනා කොට ඇත්තේ,

"අත්තානං චේ පියා ජඤ්ඤා
රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තින්නමඤ්ඤතරං යාමං
පටිජග්ගෙය්‍ය පණ්ඩිතෝ"


යනුවෙනි. තමන්ට තමන් ප්‍රිය බව දන්නේ නම් තමාගේ බාල, තරුණ, මහලු යන තුන් කාලයම ආරක්ෂා කරගන්නේය. එසේ නැතහොත් මහලු කාලයෙහි හෝ ආරක්ෂා වන්නේය යනු එම ගාථාවේ අදහසයි. ජීවිතයේ බාල, තරුණ, මහලු යන අවස්ථා තුනම ආරක්ෂා විය යුතුය. එසේ බැරි වුවහොත් මහලු කාලයේ හෝ ආරක්ෂා වීම නුවණැත්තාගේ ස්වභාවයයි. මෙහි ආරක්ෂා වීම යනු පාපකර්ම නොකර සිටීමයි. මේ නිසා මහලු කාලයෙහි හෝ සිල් සමාදන් වීම, පිනට දහමට යොමුවීම හාස්‍යයට කරුණක් නොවේ. සිල් සමාදන් වීම ලජ්ජාවට කරුණක් නොවේ.

මහලු වයසේදී හෝ සිල් සමාදන් වන්නේ නම් එය තමාට ඇතිකර ගන්නා ස්ථිරසාර ආරක්ෂාවකි. අප කෙසේ ආරක්ෂා සහිත ස්ථානවල, කෙතරම් මුරකාවල් තබාගෙන සිටියත් අවසානයට හෙවත් මරණයට පත්වීම වළක්වාගත නොහැකිය. ලොව කොහේවත් නොමැරී සිටින්නට තැනක් නැත. (න වජ්ජති සෝ ජගතිප්පදේසෝ යත්ථට්ඨිතං තප්පසහේථ මච්චු) එහෙයින් අවසාන කාලයවත් සිල්වත් ජීවිතයක් ගත කරන්නේ නම් එය මතු භවය යහපත් වීමට හේතු වෙයි.


මේ සෑම පුණ්‍ය ක්‍රියාවක්ම අප විසින් කරනු ලබන්නේ සසර ගත කරන විට සැප ඇති ආත්ම භාව ලැබීමටත්, අවසානයෙහි නිවන් අවබෝධ කරගැනීමටත්ය. ඒ සඳහා සීලයක පිහිටිය යුතුය. සීලය ශක්තිමත් පදනමක් කරගෙන භාවනාවක් පුරුදු පුහුණු කරගත යුතුය. නිර්වාණගාමිණී මාර්ගය එයයි.

සීල සමාදානය බාල, තරුණ, මහලු යන අවස්ථා ත්‍රයේදීම කළ යුතුය. එසේ බැරි වුවහොත් ජීවිතයේ සැඳෑ සමය වත් සීලයක පිහිටා ගත කළ යුතුය. එය නැණ නුවණ ඇත්තන් විසින් කරගත යුතු සත් චාරිත්‍රයකි.

දයා අංහෙට්ටිගම



"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."



# දෙවියෙක්, යකෙක් සහ මිනිසෙක්

## මේ අයගෙන් ඔබ කවුද?

'දෝණ' නම් බමුණා එක් දිනක බුදුන්ගේ පා සටහන් දැක ඒවා සාමාන්‍ය මිනිසකුගේ නොවන බව ප්‍රත්‍යක්ෂ කොට ගත්තේය. ඉන්පසුව බුදුන් හමුවට ගොස් ප්‍රශ්න කීපයක් ඇසීය.

ඒ, ඔබ දෙවියෙක්ද, ගාන්ධර්වයෙක්ද, යක්ෂයෙක්ද, මනුෂ්‍යයෙක්ද යනුවෙනි. ඒ කිසිම හැඳින්වීමක් නොපිළිගත් උන්වහන්සේ ඒ සියලු දෙනා තුළම කාම කෝපාදී කෙලෙස් ඇති බැවින් තමා ඒ සියල්ල දුරුකළ නිසා තමා හැඳින්විය යුත්තේ උත්තරීතර මනුෂ්‍යයකු ලෙස බව පැවැසීය. වැඩිදුරටත් දෝණ බමුණාට කරුණු පැහැදිලි කරදුන් අයුරු අංගුත්තර නිකායේ දෝණ ලෝක සූත්‍රයේ සඳහන් වේ.

"පුණ්ඩරිකං යථාවග්ගු - තොයේන නුප ලිප්පති

නුපලිත්තොම්හි ලෝකේන - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ"

(බමුණ, ජලයෙහි ඉපදී ජලයෙහි වැඩී ජලයෙන් ඉහළට පැමිණ ජලයේ නොගෑවී සිටිනා සුදු නෙළුමක් පරිදි මිනිසුන් අතර ඉපිද, මිනිසුන් අතර හැදී වැඩී, මිනිසුන්ගෙන් ඉස්මතු වී, මිනිසුන් සමග නොගෑවී, නොගැටී සිටින මා සියලු කෙලෙස් දුරු කළ උත්තරීතර මනුස්සයෙක් හෙවත් බුදුවරයෙකි.)

බුදුන් වහන්සේ තමා උපමා කළේ 'පද්ම' හෙවත් නෙළුම් මල හෝ මානෙල් මලකටය. ඒවා ජලයේ හටගන්නා නමුත් ජලයේ නොගෑවී ඉහළට පැමිණ සුවඳවත් කරයි. ලෝකයේ පහළ වූ බුදුන් වහන්සේද එසේමය. පද්මාකාර ජීවිතය නම් බුදුන්ගේ චරිත ස්වභාවයයි.

බොහෝ ආගමික ශාස්තෘන් තමන් මනුෂ්‍යයකු යැයි හැඳින්වීමට මැලි විය. සමහරු කියා සිටියේ තමා ඊශ්වරයා හෙවත් සර්වබලධාරී දෙවියන් බවය. නැතහොත් දෙවියන් වහන්සේ හෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයා හෝ ලොව පෙනී සිටින නියෝජිතයා බවය. එහෙත් බුදුන් වහන්සේ එකහෙලාම ප්‍රකාශ කළේ තමන් මනුෂ්‍යයකු බවත්, මනුෂ්‍යත්වයේ උපරිම තලයට පැමිණ සම්මා සම්බුද්ධත්වයට පැමිණි බුදුවරයෙක් බවත්ය. බුද්ධත්වයට පත්විය හැක්කේ මිනිසකුට පමණි. ඒ දිව්‍යමය බලයකින් නොව තමාගේ ගුණ නුවණ දියුණු කරගැනීමෙනි.

පද්මාකාර ජීවිතයක් ගොඩනගා ගැනීම සඳහා නොඑසේ නම් නිවැරදි දැහැමි ජීවිතයක් ගත කිරීම සඳහා අපට බුද්ධත්වය මෙන්ම බුද්ධ ශ්‍රාවක චරිතවලින්ද ආදර්ශ ලැබිය හැකිය. මහ මග අසල දමූ කසළ ගොඩක වුවද හොඳ සුවඳැති නෙළුම් මල් පිපී සුවඳවත් වන්නාක් මෙන් කසළ ගොඩවල් වැනි නොයෙක් අඳබාල මිනිසුන් වෙසෙන සමාජයක වුවද බුද්ධ ශ්‍රාවකයා ගුණයෙන් නුවණින් බබළන්නේය.

මිනිසුන් තුළ උපදින අකුසල සිතුවිලි, ලෝභ, ද්වේශ, මෝහ, උද්ධච්ච, දිට්ඨි, මාන, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡ, ථීනමිද්ධ, විචිකිච්චා කිසිවක් පද්මාකාර ජීවිතය ගතකරන බුද්ධ ශ්‍රාවකයා තුළ නැත. නමුත් සාමාන්‍ය මිනිසුන් තුළ නැති මෛත්‍රිය, කරුණාව, මුදිතව, උපේක්ෂාව වැනි උතුම් බඹ විහරණ මෙන්ම සීල, සමාධි, ප්‍රඥා වැනි වරණ ධර්මයන් දැකිය හැක.

ක්ෂාන්තිය හෙවත් ඉවසීම බුදු දහමේ නිතර විස්තර කෙරෙන උදාර ගුණයකි. අපට ඇතිවන තරහා ක්‍රෝධය වෛරය හා රාගාධි සිතුවිලි පාලනය කිරීම ඉවසීම නම් වේ.

සමාජයේ පවතින ප්‍රාණඝාතය, සොරකම්, කාමමිථ්‍යාචාරය, බොරුව, කේලම, හිස් වචන, පරුෂ වචන කීම, ලෝභය, ද්වේශය, ව්‍යාපාදය, මිථ්‍යා දෘෂ්ටිය ආදී දුසිරිත් දැක එම දුසිරිත්වලට ගොදුරු නොවී සිටීම පද්මාකර ජීවන රටාවකි. එසේම සතර අගතිවලට පත්නොවී පන්සිල් කඩ කරන සමාජයක එසේ කඩ නොකර අධිෂ්ඨානයෙන්ද, ක්‍රියාවෙන්ද, දස අකුසල්වලින් වැළකී, නිවැරදි ජීවිතයකට හුරුවීමෙන්ද අපටද පද්මාකර ජීවිතයක් ගතකළ හැකිය.


පූජ්‍ය යටමලගල සුමනසාර හිමි

"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී

# අටලෝ දහම සංකේතවත් කළ
## 2017 වෙසක් ලාංඡනය

United Nations Day of
VESAK
2561 B.E./2017 SRI LANKA

### එය නිර්මාණය කළ ශිල්පියා සමග පිළිසඳරක්



ලොක් ඉතිහාසයේ ඉතා වැදගත් කඩඉමක් සනිටුහන් කරමින් එක්සත් ජාතීන්ගේ බෞද්ධ සමුළුව මැයි මස 12 වැනිදා සිට 14 වැනදා දක්වා පැවැත්වේ. මෙය ශ්‍රී ලාංකීය ඉතිහාසයේ පැවැත්වෙන උත්කර්ෂවත්ම ජාත්‍යන්තර උත්සවය බවට පත්වෙනු නිසැකය. මෙම සමුළුව සඳහා වන නිල ලාංඡනය නිර්මාණය කරන ලද්දේ අපේ රටේ යොවුන් නිර්මාණවේදියකු වන ජගත් ජයසිංහ මහතා විසිනි. දුටු සැණින් ආකර්ෂණීය මෙම නිල ලාංජන නිර්මාණය මොරටුව විශ්වවිද්‍යාලයේ මෝස්තර නිර්මාණවේදය පිළිබඳ ගෞරව උපාධිධාරියකුගේ දස්කමකි. මේ වනවිට ඔහු ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ නිර්මාණ අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි.

එක්සත් ජාතීන්ගේ බෞද්ධ සමුළුවේ නිල ලාංඡනය තේරීම සඳහා පැවැත්වූ විවෘත තරගයකින් පසු එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් සහ මෙරට බුද්ධ ශාසන අමාත්‍යංශයේ බලධාරීන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් මගින් ජගත්ගේ මෙම ලාංඡනය තෝරාගෙන තිබේ. 2013 වසරේ පොදුරාජ්‍ය මණ්ඩල නායක සමුළුවේ නිල ලාංඡනය තේරීම සඳහා පැවැත්වූ විවෘත තරගයේ ජයග්‍රාහකයාමෙන්ම පොදුරාජ්‍ය මණ්ඩල මහජන සමුළුවේ නිල ලාංඡනය නිර්මාණය කිරීමේ අවස්ථාවද හිමිකරගෙන ඇත්තේ ජගත් ජයසිංහ මහතා වීම විශේෂත්වයකි. මේ ඔහු සමග කළ සුහද පිළිසඳරකි.

❑ මේ ලාංඡනයෙන් පිළිබිඹු වන්නේ මොන වගේ අර්ථයක්ද?


ලාංඡනයේ ඉහළින්ම නිරූපණය වන්නේ බෞද්ධාගමේ සංකේතය වන ධර්ම චක්‍රයයි. බෞද්ධ දර්ශනයේ උත්තරීතර බව මෙන්ම සිය ලෝකවාසීන් අටලෝදහමට යටත් වන බව හැඟවීම උදෙසා ධර්ම චක්‍රය ලෝක ගෝලයට ඉහළින් දැක්වූවා. සුදු නෙළුම පාරිශුද්ධත්වයේ සංකේතයයි. බෞද්ධ දර්ශනයේ ආලෝකය ලැබීම හෙවත් ධර්මානුකූල වීමේ අනුහසින් ලෝකවාසීන් තම ජීවිත පිවිතුරු උත්තරීතර තත්ත්වයකට රැගෙන යන අයුරු නිරූපණය කිරීමට ලෝක ගෝලය සුදු නෙළුම මත හොවා දක්වනු ලැබුවා. අප දේශය නිර්මල බුදු දහම සුරැකී පවතින ලෝක මධ්‍යස්ථානය බව දැක්වීමට ලෝක සිතියම තුළ ශ්‍රී ලංකාව වඩා ඉස්මතු කර දැක්වූවා. සමස්ත ලාංඡනයේ වර්ණ සංකලන පෙළගස්වා ඇත්තේ බුදුරැස් වළල්ලේ සහ බෞද්ධ කොඩියේ වර්ණාවලියට අනුරූපී වන අයුරින්. තවද සිංහල ගොක් කලාවේ සේසත් නිර්මාණයේ හැඩතල උකහා ගනිමින් සහ එම මෝස්තර රටාව සිහිගැන්වෙන අයුරින් මෙම බුද්ධ රශ්මි මාලා විහිද යන අයුරු නිරූපණය කළා. සේසත ශ්‍රේෂ්ඨත්වයේ සංකේතයයි. බෞද්ධ සංකල්ප අනුව යමින් හෙළ සංකේත සහ සිංහල සැරසිලි කලාවේ අංග සංයෝජනය කරමින් මෙම ලාංඡනය නිර්මාණය වී තිබෙනවා.

22 පිටුවට ▶

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."



# සැදැහැ සිතින්



දේශකයාණෝ - මහනුවර හයගිරි
විජයසුන්දරාරාම විහාරද්වයාධිපති,
ඓතිහාසික බදුලු මුතියංගණ රාජමහා
විහාරාධිපති, ශ්‍රී දළදා මාළිගාවේ තේවාවහාර,
අතිගෞරවාර්හ
වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද
ඤාණරතනාභිධාන
මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ
අස්ගිරි මහාවිහාර පාර්ශවයේ මහානායක
මාහිමිපාණන් වහන්සේ

## තෙරුවන් සරණ ගොස් සසර කතරින් එතෙර වෙමු

"ඉධ මහානාම අරියසාවකො තථාගතං අනුස්සරති: 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. යස්මිං මහානාම සමයෙ අරියසාවකො තථාගතං අනුස්සරති."

(අංගුත්තර නිකාය, ඡක්ක නිපාතය)

*"මහානාමයෙනි, මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවකයන් මේ මේ කාරණයෙන් 'ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්‍ය, සම්‍යක් සම්බුද්ධය, විද්‍යාචරණ සම්පන්නය, සුගතය, ලෝකවිදූය, අනුත්තර-පුරිසදම්මසාරථීය, දෙව්මිනිසුන්ට ශාස්තෘය, චතුස්සත්‍ය ප්‍රතිබද්ධය, භගවත්ය' යැයි තථාගතයන් වහන්සේ අනුස්මරණය කෙරෙයි."*


පින්වත්නි,

ශ්‍රී ගෞතම තථාගත සර්වඥයන් වහන්සේ, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ පාරමී දම් සපුරා, දඹදිව කපිලවස්තුපුර ශාක්‍ය කුල සුද්ධෝදන මහරජුට දාව, මහාමායා මවුකුස පිළිසිඳ, දසඑකඩමස් සපුරා ලුම්බිණී සාල වනෝද්‍යානයේ දී මෙලොව උත්පත්තිය

''සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය.

ලැබීමත්, මහා කරුණාවෙන් තුන්ලෝසතුන් සසර දුකින් එතෙර කරනු පිණිස රජ සැප හැර දමා, සියලු බුද්ධ කාරක ධර්මයන් සපුරා, දස මරුන් පරදා චතුරාර්ය සත්‍ය ධර්මය ස්වයංභූඥානයෙන් අවබෝධ කොට වදාරා, සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත් වීමත්, තමන් වහන්සේ අවබෝධ කොට ගත් ශ්‍රී සද්ධර්මය සියලු ලෝක වාසීන්ගේ හිත පිණිස සුව පිණිස පරාර්ථ චර්යාවෙන් දේශනා කොට වදාරා අසූ හවුරුදු වියේ දී කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවර්තන නම් සාල වනෝද්‍යානයේ දී පිරිනිවන් පෑමත් යන ත්‍රිවිධ මංගල්ලය, ලොවට පරම ශාන්තිය උදා කර දුන් ශ්‍රේෂ්ඨ වෙසක් පුන් පොහෝ දිනයකදීම සිදු විය.

තිලෝගුරු සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ මෙම අසිරිමත් තෙමගුල සිහිපත් කොට නානාවිධ ආමිෂ ප්‍රතිපත්ති පුද පූජා උපහාර පැවැත්වීම, දුගී පැළේ සිට මහමැදුරුවල වෙසෙන සියලු බෞද්ධයන්ගේ සිරිතයි. වෙසක් පුන් පොහෝ දිනයේ දී පමණක් දාන, ශීල, භාවනාදියෙහි යෙදී වාසය කිරීම නියම බෞද්ධකම නොවේ. මුලු ජීවිතය පුරාවටම බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි අචල ශ්‍රද්ධා පූර්වංගම චිත්තයෙන් යුක්තව ජීවිතය ගෙවීම බෞද්ධ උපාසකයෙකු සතු පරම යුතුකමයි. නියම බෞද්ධයෙකු බවට පත් වන්නේ, දිවි හිමියෙන්, අචල ශ්‍රද්ධා පූර්වංගම චිත්තයෙන්, විශ්වාසයෙන් ගෞතම තථාගතයන් වහන්සේගේ නව අරහාදී අනන්ත වූ බුදු ගුණයන් ගැනත්, ස්වාක්ඛාත වූත්, සාන්දෘෂ්ටික වූත්, අකාලික වූත්, එහිපශ්‍යික වූත් ශ්‍රී සද්ධර්මයේ ගුණයත්, සුප්‍රතිපන්න වූත්, ඍජුප්‍රතිපන්න වූත්, ඤායප්‍රතිපන්න වූත්, සාමීචිප්‍රතිපන්න වූත්, ආහුණෙය්‍ය වූත්, පාහුණෙය්‍ය වූත්, දක්ඛිණෙය්‍ය වූත්, අඤ්ජලීකරණීය වූත්, ලෝකයාට අනුත්තර පුණ්‍ය ක්ෂේත්‍රයක් බඳු වූත් මහා සංඝ රත්නයේ ගුණයත් ප්‍රණාමයෙන්, ගෞරවයෙන්, විශ්වාසයෙන්, ශ්‍රද්ධාවෙන් සරණ යෑමෙනි.



ආර්ය ශ්‍රාවකයන්, නිර්මල බුදුදහම සිහි කරත් නම් ඔහු තුළ රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් පිරුණු සිතක් ඇති නොම වේ. ප්‍රමුදිත වූ සිතක් ඇති වෙයි. එවිට ප්‍රීතිය උපදියි. ප්‍රීතියෙන් යුත් සිතැත්තාගේ කය සංසිඳෙයි. කය සංසුන් වූ විට කායික චෛතසික සුඛය ඇති වෙයි. එසේ සුවැත්තාගේ සිත තුළ සමාධිය ඇති වෙයි. නිදුක් වෙයි. මෙසේ තෙරුවන් සරණ යන සැදැහැවත් බෞද්ධයා සැබෑ බෞද්ධයෙක් වන්නේය.

තමන්ට ශ්‍රද්ධාවක් නූපදින්නේ නම් නිකම් කියන්නන් වාලේ අර්ථයක් නැති විදියට ගාථා පාඨ කියවීමෙන් පමණක් තෙරුවන් සරණ යෑමේ නිසි ආනිසංස නොලැබේ. චපල නැති, නොසෙල්වෙන ශ්‍රද්ධාවක් සිතේ පිහිටුවා ගෙනම සිතේ විශ්වාසයෙන්ම තෙරුවන් සරණ යා යුතුය. ශ්‍රද්ධාවත් බෞද්ධයෙකුට උදේ හවස සූවිසි බුදු ගුණයන් සිහිපත් කර ගැනීමේ දී තමාගේ අවබෝධය වැඩි වන්නට පටන් ගනී. තෙරුවන් ගුණ තමන් තුළ අවබෝධ වීම වැඩිවත්ම කෙලෙස් ප්‍රහාණය වී කුසල් පිරෙයි. තෙරුවන් ගුණ ශ්‍රද්ධාවෙන් සිහිපත් කිරීමට වෑයම් කිරීමෙන් තමා තුළ තිබෙන කරුණා, මෛත්‍රී ආදී හොඳ ගුණ තව තවත් වර්ධනය වේ. තමා තුළ නැති ගුණ සිතේ දියුණු වේ. එසේම තමා තුළ ඇති නරක ගුණ මර්ධනය කර ගැනීමට ඒ වීර්යය ඉවහල් වේ. එසේම හිතේ නැති නරක සිතුවිලි ඇතුල් වීමට ඉඩ නොදෙයි. සිතෙහි සිහිය වැඩිවෙයි. එවිට හොඳ වැඩ පමණක් කිරීමට පෙළඹෙයි. එමගින් හොඳ දෙය හොඳ හැටියට දියුණු කිරීමට උත්සාහ දැරීමටත්, නරක දෙය ප්‍රහාණය කිරීමටත් අවස්ථාව සැලසෙයි.

යමෙක් බුදුන්, දහම්, සඟුන් අපරිමිත ශ්‍රද්ධාවෙන්, අචල විශ්වාසයෙන් සරණ නොයන්නේ නම් ඔහු නිසි බෞද්ධයෙකු නොවේ. නිසි සැදැහැයෙන් තෙරුවන් සරණ යන තැනැත්තාම නියම බෞද්ධයෙකු බවට පත් වේ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇති කර ගත යුත්තේ ප්‍රඥාව පෙරදැරි කරගෙනමය. එවිට තෙරුවන් ගුණ නිසි ලෙස දැනගැනීමට අවස්ථාව සැලසෙයි. භවයෙන් මිදීමට ඇති එකම සරණ තෙරුවන් සරණ බව දැඩි විශ්වාසයෙන් යුතුව, නිවන් සුව ලැබීමේ පරම අභිලාෂයෙන්ම තෙරුවන් සරණ යාමෙන් නියම බෞද්ධයෙකු බවට පත් වේ. සසර දුකින් මිදෙනු වස්, නැවත නැවත ඉපදීමෙන් මිදෙනු පිණිස ලද යුත්තේත්, පැතිය යුත්තේත් නිවනමය.

නිවන අපේක්ෂා කරන බෞද්ධ උපාසකයන් තුළ ශ්‍රද්ධා, සීල, ශ්‍රැත, ත්‍යාග යන ගුණයන් මනාව වඩා වර්ධනය විය යුතුය. මිථ්‍යා දෘෂ්ටියෙන් මිදී, අන් සරණක් ගැන නොසිතා, නොපතා තෙරුවන් ගුණ කෙරෙහිම මනා විශ්වාසයෙන් රත්නත්‍රය සේවනය කළ යුතුය. නියම ආර්ය ශ්‍රාවකයා විසින් තථාගතයන් වහන්සේගේ ගුණ නිතර සිහිපත් කොට සිල් රැකිය යුතුය. බණ දහම් ඇසිය යුතුය. දන් පින් කළ යුතුය. තථාගතයන් වහන්සේගේ ගුණ නිතර සිහිපත් කරන තැනැත්තා කෙරෙහි රාගයෙන් පිරිපුන් සිතක් ඇති නොම වන්නේය. ද්වේෂයෙන්, මෝහයෙන් පිරිපුන් සිතක් ද ඇති නොවන්නේය. ඔහුගේ සිත තථාගතයන් වහන්සේ කෙරෙහි ඍජු වෙයි. එසේ ඍජු වූ සිත් ඇති තැනැත්තාගේ සිත තුළ ප්‍රීති ප්‍රමෝදය වැඩෙයි. තථාගතයන් වහන්සේ කෙරෙහි ප්‍රීති ප්‍රමෝදයට පත් වූ සිත් ඇති විට රූපය හැර වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන නාම කාය ද, හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් ශරීරය හෙවත් කරජ කාය ද සංසිඳෙයි. සන්සුන් කය ඇති වූ විට සුවයට පත් වෙයි. සුව වූ සිත් ඇති තැනැත්තාගේ සිත ඒකාග්‍ර වෙයි. එවිට ශීල, සමාධි, ප්‍රඥා වඩා වර්ධනය කර ගැනීම පහසුය.

ශ්‍රද්ධාවෙන් යුක්ත වූ සිත් ඇති විට තෘෂ්ණාවෙන් මිදීම පහසුය. සමාධියට ලැදිව ශීලයෙහි පිහිටයි. ආර්ය ශ්‍රාවකයා ශීලය සිහි කරන විට රාගයෙන් වෙළුණු සිත් ඇති නොවන්නේය. ද්වේශයෙන්, මෝහයෙන් වෙළුණු සිත් ඇති නොවන්නේය. ඔහුගේ සිත ශීලය කෙරෙහිම ඍජු වෙයි. දීමෙහි ඇලෙයි. දුන් දානය ගැන සිහි කරමින් නිරාමිෂ ප්‍රීතියට පත් වෙයි. ත්‍යාගය කෙරෙහි ඍජු වූ සිත් ඇති විට ධර්මවේදය, අර්ථවේදය ලබන්නේය. ප්‍රීතියෙන් යුත් සිත් ඇති ඔහුගේ කය සංසිඳෙයි. සිතෙහි සමාධිය ඇති වෙයි.

භික්ෂූන් වහන්සේගේ ධර්මාශ්‍රය නොපැතීම, බණ නොඇසීම, ශීලයන්හි නොපිහිටීම, භික්ෂූන් වහන්සේ කෙරෙහි කලකිරුණු සිත් ඇති වීම, සිදුරු සොයන අදහසින් බණ ඇසීම, පළමුවෙන් පිදිය යුතු සංඝ රත්නය අමතක කොට බාහිර තීර්ථකයන්, තාපසයන් ආදීන් පිදීම බෞද්ධයෙකුගේ පිරිහීමට මූලික වේ.

මෙබඳු දුර්වලතාවන්ගේ වැළකී සැදැහැ සිතින් තෙරුවන් සරණ යෑමෙන් කුසල් දහම් වඩමින් සසරින් එතෙර වීමට මෙම උතුම් වෙසක් පුන් පොහෝ දිනයේ දී අදිටන් කර ගනිමු.

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."



# සම්බුද්ධ පරිනිර්වාණය

## මංගල කාරණයක් වන්නේ කෙසේදැයි බොදු ඇසින් විමසමු

දෙදහස් පන්සිය හැට එක්වන සම්බුද්ධ ජයන්ති වෛශාඛ්‍ය මංගල්‍යය මේ වසරේත් ව්‍යවහාර වර්ෂ ක්‍රමය අනුව මැයි මස 10 වන දිනට යෙදී තිබේ. ප්‍රධාන වශයෙන් මෙරට අනුරාධපුර යුගයේ පටන් වෙසක් උත්සව උත්කර්ෂවත්ව රාජ්‍ය අනුග්‍රහයෙන් සිදුකරන ලද බව මහාවංසය ආදී මෙරට වංසකතා මෙන්ම පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාව ආදියෙන්ද පෙනී යයි. දුටුගැමුණු රජතුමා වෙසක් උත්සව සූවිස්සක් පැවැත්වූ බව මහාවංසය දක්වයි. වෙසක් උත්සවය බෞද්ධ ලෝකයාට පමණක් නොව සමස්ත සත්ත්ව ප්‍රජාවටම වැදගත් වන්නකි. ඒ ජාති, ජරා, ව්‍යාධි, මරණාදී සැමට ගොදුරු වීමට සිදුවන සාංසාරික දුක්වලින් ස්ථිරසාර ලෙස සදහටම අත්මිදෙන මාර්ගය ලොවට අනාවරණය කළාවූ ගෞතම සම්බුදුරජාණන් වහන්සේගේ උප්පත්තිය, සම්බුද්ධත්වය සහ පරිනිර්වාණය මේ උතුම් පොහෝ දිනයේදී අනුස්මරණය කිරීමයි. මෙම ලිපිය තුළින් අප බලාපොරොත්තු වන්නේ සම්බුද්ධ පරිනිර්වාණය පිළිබඳ තොරතුරු බිඳක් ගෙනහැර දැක්වීමය.

මෙහිදී පළමුවෙන්ම යමකුට ඇතිවිය හැකි ගැටලුවක් වන්නේ පරිනිර්වාණය මංගල්‍යයක්ද යන්නයි. බුදු කෙනකුගේ පරිනිර්වාණය ලෝ සතුන්ගේ පක්ෂයෙන් ගත් කල අභාග්‍යයකි. එසේ වුවද එය බුදුරජාණන් වහන්සේගේ පක්ෂයෙන් ගත් කල උන්වහන්සේගේ සමස්ත බුදු සිරිතේම කූට ප්‍රාප්තිය හෙවත් ශ්‍රේෂ්ඨතම මංගල අවස්ථාවය. දීපංකර බුදුන් අබියසදී සසර දුක් නිමා කරගත හැකිව තිබියදී බෝධිසත්ත්වයන් වහන්සේ භයානක සසරට වැද සමත්‍රිංසත් පාරමී ගුණ පිරුයේ ලෝ සතුන්ද සසර දුකින් මුදවනු පිණිසය. ඒ අනුව සියලු බුද්ධ කාරක ධර්ම සපුරා සිද්ධාර්ථ කුමාරව මෙලොව උපත ලබා සියලු සැප සම්පත් අතහැර පැවිදිව මධ්‍යම ප්‍රතිපදාවෙන් උන්වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය ප්‍රතිවේධ කළහ.

සම්බුද්ධත්වත් සමග උන්වහන්සේ යළි උපතක් ගෙන දෙන්නා වූ තණ්හා, උපාදාන සහිත සකලක්ලේෂ ධර්මයන් මුලිනුපුටා දැමූහ. ඒ අනුව ගයාවේ බෝ මැඩදීද උන්වහන්සේ පිරිනිවුණහ. එය සෝපධිසේස පරිනිර්වාණය හෙවත් ක්ලේෂ පරිනිර්වාණය යනුවෙන් හැඳින්වේ. එනම් ස්කන්ධ පඤ්චකය ඉතිරිව තිබියදී තණ්හා, උපාධාන, භව ආදී යළි ඉපදීම ඇතිකරවන හේතු නැති කිරීමය. මෙය බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයත් සමග පළකළ උදාන වාක්‍යයෙන්ද ඉදිරිපත් කොට තිබේ.

ගෞතම සම්බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත්වන්නේ සුවිසල් මාර සංග්‍රාමයක් විජයග්‍රහණය කිරීමෙනි. එසේ පැරද පළා ගියද බුදුවූ අලුතම මාරයා නැවත බුදුන් වහන්සේ කරා පැමිණෙන්නේ,

''ස්වාමීනි, දැන ඔබවහන්සේ බුදුවී හමාරය. ඔබවහන්සේගේ අරමුණ දැන් ඉටුවී ඇත. දැන් කළ යුත්තේ

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''

පිරිනිවන් පෑමය'' යන ප්‍රකාශය කිරීමටය. එහිලා බුදුරජාණන් වහන්සේ මාරයාට පෙන්වා දෙන ලද්දේ සිව් පිරිස ව්‍යක්ත, විනීත, විශාරද, ධර්මධර, විනයධර ධම්මානුධම්ම පටිපන්න ප්‍රතිබලසම්පන්න පිරිසක් වනතෙක් තමන් වහන්සේ පිරිනිවන් නොපාන බවය. ඒ අනුව බුදුරජාණන් වහන්සේ පන්සාළිස් වසක් පුරා,

**තමන් වහන්සේ සම්බුදුව ලෝ සතුන්ගේ අවබෝධය පිණිස දහම් දෙසූහ.**

**තමන් වහන්සේ දමනය වී ලෝ සතුන්ගේ දමනය පිණිස දහම් දෙසූහ.**

**තමන් වහන්සේ සසර තරණය කොට ලෝ සතුන්ගේ තරණය පිණිස දහම් දෙසූහ.**

**තමන් වහන්සේ පිරිනිවී ලෝ සතුන්ගේ පිරනිවීම පිණිස දහම් දෙසූහ.**

ඒ අනුව බලන කල පිරිනිවීම බුද්ධ ශාසනයේ වැදගත් මංගල්‍යයකි. තණ්හාව දුරු කිරීමෙන් ලබන නිර්වාණය පරිපූර්ණ වන්නේ අතීත කර්මය නිසා හටගත් දිරන, ලෙඩ වන, මැරෙන පඤ්චස්කන්ධයෙන්ද අත් මිදුණු කල්හිය. එය අනුපධිසේස පරිනිර්වාණය හෙවත් ස්කන්ධ පරිනිර්වාණය වශයෙන් හැඳින්වේ. බුදුවරුන්ගේ, රහතුන්ගේ පරිනිර්වාණය පහන් සිළක් නිවී යාමක් බඳුය. උන්වහන්සේලා නැවත මව් කුසක හෝ අන් ක්‍රමයකින් නූපදී. එය බුදු සසුනේ ඉගැන්වෙන උත්තම අවස්ථාවය.

බුදුන් වහන්සේගේ පරිනිර්වාණය පිළිබඳ දීර්ඝ තොරතුරු දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයෙන් දැකිය හැකිය. අසූ වයස් පිරුණු භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණය සඳහා ශාරීරික අපහසුතා පවා නොතකා දීර්ඝ ධර්ම චාරිකාවක යෙදෙන සැටි එම සූත්‍රයෙන් පෙනේ. ඒ තුළින් බුදුන් වහන්සේගේ මහා කරුණාවත්, මහා ප්‍රඥාවත්, නිකෙලෙස් මානුෂිකත්වයත් මැනවින් පැහැදිලි වෙයි.

පිරිනිවන් මඤ්චකයේ වැඩ සිටත් අවසාන වශයෙන් තමන් වහන්සේ කරා පැමිණි සුභද්දට පවා භාග්‍යවතුන් වහන්සේ ධර්ම මාර්ගය විවර කර දුන්හ. ධර්ම විනය පිළිබඳ යම් ගැටලුවත් වෙතොත් එය විමසන මෙන් නැවත නැවත මතක් කළහ. ධර්මය, අධර්මය තේරුම් ගැනීමට උපදේශ හතරක් වදාළහ. අප්‍රමාදී බවේත්, සීල, සමාධි, ප්‍රඥා වැඩීමේ වැදගත්කමත් නිරතුරුව පෙන්වූහ. අවසානයේදී මෙසේ වදාළහ.

**''මහණෙනි, මම දැන් නුඹලා අමතමි. සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළුය. අප්‍රමාදීව කුසල් දහම් සම්පාදනය කළ යුත්තේය.''**

මේ ප්‍රකාශයෙන් පසුව භාග්‍යවතුන් වහන්සේ කිසිවක් නොවදාළහ. ඉනික්බිතිව ප්‍රථම ධ්‍යානයේ පටන් සතර වන ධ්‍යානය දක්වා සම වැදුණහ. සිව්වන ධ්‍යානයෙන් නැගිට ආකාකිනඤ්චායතන, විඤ්ඤාණංචායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤා නාසඤ්ඤායතන ධ්‍යානවලට පිළිවෙළින් සම වැදෙමින් සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට සම වැදුණහ. අනතුරුව එම ධ්‍යානවලට අනුලෝම ප්‍රතිලෝම වශයෙන්ද සම වැදෙමින් සතරවන ධ්‍යානයෙන් නැගී සිට සම්බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ සේක.

සම්බුද්ධ පරිනිර්වාණයත් සමග මහ පොළොව කම්පා වන්නට විය. දිව්‍යමය බෙර නාද විය.

සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළුය. එසේම ලෝකයේ අසම සමවූ, තිලෝගුරු වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේද පිරිනිවන් පෑහ යනුවෙන් සහම්පතී මහා බ්‍රහ්මයා කීය.

ඉපදීම හා විනාශය ස්වභාව කොට පවතින සංස්කාර ඒකාන්තයෙන්ම අනිත්‍යය. එහෙයින් පරිනිර්වාණයම සැපයකි යනුවෙන් ශක්‍ර දිව්‍ය රාජයා කීය.

කුසිනාරාවේ උපවත්තන සල් උයනේදී පිරිනිවන් පෑ බුදුරදුන්ගේ සම්බුදු සිරුර මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ මහරහතුන් සහිත මහා සංඝයා ඉදිරියේදී රාජ රාජ මහාමාත්‍යාදීන්ගේද, දෙව් මිනිසුන්ගේද අප්‍රමාණ



පුද පූජා මධ්‍යයේ මකුට බන්ධන නම් ස්ථානයේදී ආදාහනය විය.

ගෞතම සම්බුදුරජාණන් වහන්සේගේ ශරීර ධාතු දෙව් මිනිසුන්ගේ වන්දනා මානන පිණිසද, සසුන බොහෝ කල් පැවතීම පිණිසද ධාතුන් වහන්සේලා කිහිප නමක් හැර සෙසු සියල්ල ප්‍රමාණ කිහිපයකම විසිරුණහ. ඒ ධාතුන් වහන්සේලා වර්තමානයේද දෙව් ලොව, බඹ ලොව, නා ලොව, මනු ලොව සැදැහැතියන්ට අප්‍රමාණ පූජාවන්ට පාත්‍රව පවතී.


ගෞතම සම්බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වසර දෙදහස් පන්සිය හැට එකක් මෙම වෙසක් පුන් පොහෝ දිනට සපිරෙයි. උන්වහන්සේගේ ශරීර ධාතුන් වහන්සේලාද, සද්ධර්මයද, නිර්වාණ මාර්ගයද තවමත් ලොව විරාජමානව පවතී. එහෙයින් ගෞතම බුදු සසුනේ අප්‍රමාදීව නිර්වාණ මාර්ගය වැඩීම බුදුන් වහන්සේට පවත්වන උත්තම පූජාවය.

**පූජ්‍ය හෙම්මාතගම පියදස්සි හිමි**

සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ.''

# නමට විතරක් බෞද්ධයකු වෙන්න එපා

## සැරසිල්ලකට එහා ගිය උතුම් තෙමඟුලේ සැබෑ අරුත අත් විඳිමු



තවත් වෙසක් පොහෝ දිනයක් උදාවිය. වෙසක් මංගල්‍යය සැමරීම සඳහා ලක්වැසි සියලු බෞද්ධයෝ විවිධ ආගමික කටයුතු අරඹා සිටිති. පුද පූජා, වන්දනා, ධර්ම දේශනා හා ධර්ම සාකච්ඡා, පිරිත් පිංකම්, පොත්පත් සඟරා මුද්‍රණය, සීල සමාදාන, භාවනා වැඩසටහන්, උත්සව සැරසිලි ආදිය ඒ අතර වෙයි.

නමුත් සිතන්නට කරුණක් තිබේ. එනම් මේ කාර්යය කෙතරම් ඉහළින් සිදුකළද සැබෑ බෞද්ධකම මේ සංස්කෘතික කටයුතුවලට ඔබ්බෙහි තිබෙන්නක් බවය.

දහම් ගුණ අතර ''පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි'' යන ගුණයද වෙයි. එයින් කියැවෙන්නේ මේ දහම විඤ්ඤූන් විසින් තම තමා කෙරෙහි වෙන වෙනම දනගත යුතු බවයි. විඤ්ඤූ යනු නුවණැත්තන් යැයි සාමාන්‍යයෙන් කියනු ලැබේ. එහෙත් එයින් උගතා, පණ්ඩිතයා, විද්වතා යන අරුත ඉදිරිපත් නොවේ. මේ සඳහන් කළ සියල්ලෝද විඤ්ඤූන් විය හැකියි. එහෙත් ඒ අය විඤ්ඤූන් නොවීමටද ඉඩ තිබේ. දහමෙහි දක්වෙන අයුරු විඤ්ඤූ යනු කපටි නැති, මායාකාරී නොවන, ඍජු පිළිවෙත පිහිටි තැනැත්තායි. කියන දේ කරන, කරන දේ කියන, හිතන දේ කියන කරන අවංක, අකපට තැනැත්තාම විඤ්ඤූ නම් වේ. ප්‍රසිද්ධියට එකකුත්, අප්‍රසිද්ධියේ එයට හාත්පසින් වෙන දෙයකුත් කරන කියන හා සිතන තැනැත්තා දහම දකගත හැකි අයෙක් නොවෙයි. ඉහත සඳහන් කළ සංස්කෘති කටයුතු විඤ්ඤූ නොවන අයටත් ඉටු කළ හැකිය. එනිසා ඒ කටයුතු මැනැවින් ඉටු කළ පමණින් සැබෑ බෞද්ධයකු බවට පත් නොවේ.

එසේ නම් පළමුවෙන්ම විසඳා ගන්නට ඇති පැන, සැබෑ බෞද්ධයකු වන්නේ කෙසේද යන්නයි. නිවන් පිළිවෙතෙහි ගමන් ඇරැඹූ තැනැත්තා සැබෑ බෞද්ධයා බව දහමෙන් ප්‍රකාශ වේ.

නිවන් පිළිවෙත යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. තමා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් අරඹා ඇත්තෙක්ද යන්න ඊළඟට විසඳා ගත යුතුව ඇත. නිරන්තරයෙන් තෙරුවන් සරණ යෑමේ හා පන්සිල් ගැනීමේ පාලි පාඨ (හෝ සිංහල වාක්‍ය) කියවූ තරමින් ආර්ය මාර්ගයට බැසගත් පුද්ගලයෙක් වේද?

''වෛරී මිනිසුන් මැද අවෛරීව ජීවත් වන්න.''

බෞද්ධයා නම් උපතින් ඇරඹුණ ජීවිතය මරණයෙන් අවසන් වේ යැයි සිතන්නෙක් නොවේ. බෞද්ධයා භවගාමී ජීවිතයක් ඇතැයි පිළිගන්නෙකි. අනාගත භවයන්හිදී ස්වකීය කුසලා කුසල කර්මයන්ට අනුව සුගති සැප මෙන්ම දුගති දුක් විඳීමටද සිදුවන බව හෙතෙම පිළිගනියි. එනිසා අනාගතයේදී දුගතිදුක් විඳීමට සිදු නොවේ යැයි යම් අවස්ථාවකදී නිශ්චිතව සිතා ගැනීමට පුළුවන් වේද, සැබෑ බෞද්ධකම ඇරඹෙන මොහොත එයයි. මෙසේ සැබෑ බෞද්ධකම ඇරඹෙන මොහොත සොයාගන්නේ කෙසේද?

ඒ අති උත්කෘෂ්ට මොහොත සෝතාපන්න ඵලයට පත්වීමයි. එහෙත් සෝතාපන්න මාර්ගයට අවතීර්ණ වූ පසු, පුද්ගලයා දුගතිගාමී මාර්ගයට අවතීර්ණ වූ පසු, පුද්ගලයා දුගතිගාමී නොවන බවට දහමෙන් සහතිකයක් ලැබේ. සෝතාපන්න බව මේ මොහොතේ නොලැබුවද මාර්ගයට අවතීර්ණවීමට පුළුවන් නම්, ඒ සහතිකය දහමෙන් ලබාගත හැකිය. මේ නිසා බෞද්ධයාගේ උත්සාහය විය යුත්තේ ඒ සහතිකය හැකි ඉක්මනින්ම ලබා ගැනීමය. එය ලබන ආකාරය ගැන කතා කිරීමට පළමු ඔබ තුළ බල පවත්වන සැක සංකා කිහිපයක් ගැන විමසා බැලීමට සිදුවේ.

1. බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටි කාලයේ පැවැති සරල සමාජයේ පුළුවන් වුවත්, අද වැනි සංකීර්ණ සමාජයක ජීවත් වන අපට සැබෑ බෞද්ධයන් වීමට පුළුවන්ද?

2. ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් නැති අපට එය සමත්ද?

3. උගතුන්ටත් බැරි දෙයක් නූගත් අපට පුළුවන්ද?

4. දූන් බුදු සසුනේ අවසන් කාලයයි. ඒ ප්‍රතිඵල දූන් ලබාගත හැකිද?

මේවා සියල්ලම දහම නොදන්නාකම නිසා ඇති කරගත් බොළඳ සිතුවිලිය. එසේ කිව යුත්තේ ඇයි?

බුදුහාමුදුරුවන්ගේ කාලයේ පුළුවන් වුවත් දූන් නම් නිවන් මගට එළඹීමට නුපුළුවනැයි කීම බුදු බණට සෘජුවම එරෙහි වීමකි. ගිහි පැවිදි ශ්‍රාවකයන් දහම් මගෙහි ගමන් කරන තාක් ලෝකය රහතුන්ගෙන් හිස් නොවෙතැයි දේශනා කරන ලද්දේ ශාස්තෘන් වහන්සේ විසින්මය. දහම් මග අදද පැහැදිලිව ප්‍රකටව තිබෙන බව නිසැක කරුණකි. රහත් බව නිවන් මගේ අවසන් තැනයි. එතැනටත් පත්වන්නට පුළුවන් නම් එහි ආරම්භක අවස්ථාවට පත්වීමට කිසිදු ආකාරයකින් බැරිකමක් නැත.

අද ඇත්තේ ඉතා සංකීර්ණ සමාජයක් බවද ඇත්තකි. නවතම තාක්ෂණික මෙවලම් භාවිතය හා ශීඝ්‍ර සන්නිවේදන ක්‍රම නිසා එය සිදුවී තිබේ. ඒ අනුව පුද්ගල හැසිරීම් රටාද විපර්යාසයකට භාජනය වී තිබේ. එහෙත් එදා මෙන්ම අදත් මිනිසුන්ගේ මූලික ස්වභාවය එකමය. එදා මෙන් අදද මිනිස්සු ලෝභ, ද්වේෂ, මෝහ යන මූලික දුර්වල අදහස් තුනෙන් මෙහෙයැවන්නෝ වෙති. තෘප්තිමත් නැත. තෘෂ්ණාවට වහල්ය. අඩුවක් දකිමින්ම මරණයට පත්වෙති. (අතිත්තෝ තණ්හාදසෝ: ඌනාව දහුත්වාන ජහන්ති දේහං) යන්න අද මෙන්ම එදාද මිනිසාගේ සාමාන්‍ය ස්වභාවයයි. මෙවලම් සන්නිවේදන ක්‍රම, චර්යා රටා, කොතෙක් දුරට වෙනස් වුවත් මේ මූලික ස්වභාවයන් එසේම පවතී. එනිසා මේ ස්වභාවයන් ජයගෙන විමුක්තිය ලබාගැනීම සඳහා එදා පෙන්වා දී ඇති මාර්ගය අදටද එලෙසම වලංගුය.

කාමභෝගී ජීවිත ගත කිරීම පෘථග්ජන මිනිසුන්ගේ සාමාන්‍ය ස්වභාවයයි. ඒ කාමභෝගී ජීවිත එලෙස ගත කිරීමටද අද මෙන්ම එදා මිනිසුන් අපේක්ෂා කළහ. ඒ බව ව්‍යග්ඝපජ්ජ, වේළුද්වාර වැනි ප්‍රකට සූත්‍ර ධර්මවලින් හෙළිවේ. ඒ මිනිසුන්ට





ඒ ජීවිතම තවදුරටත් ගත කරමින් ආර්ය මාර්ගයට බැස ගැනීමට පුළුවන් මගකි බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දේ.

''නිවන් මග ඇරඹීමට ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් අවශ්‍යය. අපට ත්‍රිහේතු ප්‍රතිසන්ධියක් නැත. එනිසා අපට නිවන් මගට එළඹිය නොහැක'' යන්න බෙහෙවින් ප්‍රචලිත දුර්මතයකි. එය දුර්මතයක් වන්නේ ඔබ ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් නැති අයකු යැයි ඔබ විසින් හෝ වෙනත් අයකු විසින් තීරණය කර තිබීම නිසාය. එවැනි තීරණයක් ගත හැක්කේ බුදුවරයකුට හෝ



අභිඥලාභී මහ රහතන් වහන්සේ නමකට පමණි. ඔබ ගෙන ඇති තීරණය එවැනි උතුමකුගෙන් ලැබී නැති නිසා එය මුලාවීමකි.

දහම නුවණැත්තන්ටය යන්නද ප්‍රචලිත මතයකි. ඒ නුවණැත්තෝ දහමෙහි හැඳින්වෙන විඤ්ඤූ පුරුෂයෝය. මීට පළමු ඒ අය ගැන විස්තර කරන ලදී. විඤ්ඤූ පුරුෂයන් මළපොත අකුරු නොදන්නා අය අතරද සිටිය හැකිය. මගඵල ලද නූගත්, පහත් පෙළේ ජීවිත ගත කළ ගැහැනු මිනිසුන්ගේ කතාවලින් ඒ බව තහවුරු වේ.

බෞද්ධයා කළ යුත්තේ තවමත් සුරැකිව තිබෙන පෙළ දහමට අනුව කරුණු විමසා බලා සැබෑ බෞද්ධයකු වීමේ කාර්යය ඇරැඹීමයි. ආර්ය මාර්ගයේ හෙවත් නිවන් මගේ පළමු වරට ස්ථාවරත්වය ලබන්නේ සොතාපන්න ඵලයට පත්වීමෙනි. අර්හත්වය පමණක් නොව සෝතාපන්න තත්ත්වයද ක්‍රමානුකූල පිළිවෙතක පිහිටා ගමන් කිරීමෙන් ලබාගත යුත්තකි. ඒ ගමන ඇරැඹෙන්නේ සෝතාපන්න මාර්ග යෙහි පියවර තැබීමෙනි.

යමකු සෝතාපන්න මාර්ගයට පිවිසුණු පසු සෝතාපන්න ඵලයට නොපැමිණි මිය නොයන බවටද දහමෙන් සහතිකයක් ලැබී තිබේ. ඔක්කන්ති සංයුක්තය පුරාම මේ කරුණු අවධාරණය කර තිබේ.

සෝතාපන්න මාර්ගයට පිවිසෙන්නේ කෙසේද? ඒ සඳහා දූන් ගත කරන කාමභෝගී ජීවිතය අත්හල යුතු නැත. අවාහ විවාහ වීමටත්, පෙම් කිරීමටත්, විනෝද වීමටත්, මුදල් ධනය සොයා සපයා ගැනීමටත්, ධනය නිසි පරිදි රිසි සේ වියදම් කර සැපවත් වීමටත්, සමාජ කටයුතුවල නිරතවීමටත්, කිසිදු බාධාවක් එයින් සිදු නොවේ. අවශ්‍ය වන්නේ මේ හැම කාර්යයක්ම බෞද්ධකම රැකෙන පරිදි කිරීමයි.

ඒ සඳහා ඔබ තුළ ශ්‍රද්ධාව ඇතිකර ගත යුතුය. එය මූලික අවශ්‍යතාවය. එහෙත් ශ්‍රද්ධාව ගැන වැරදි අදහස් පැතිර තිබේ. නිතර පන්සල් යෑම, ආගමික කටයුතුවල නිරතවීම පමණක්ම ශ්‍රද්ධාව නොවේ. ශ්‍රද්ධාව නැති අයද මේවායේ නිරත වෙති.

තරමක් හෝ කරුණු වටහාගෙන තෙරුවන් සරණ යන්නේ නම්, පන්සිල් රැක ගැනීමට තරම් සංවර වන්නේ නම් එය ශ්‍රද්ධාවය, එය ශ්‍රද්ධා ඉන්ද්‍රියය.

පන්සිල් රැකීමට යම්කිසි උත්සාහයක් ගත යුතුය. ක්‍රෝධ සිතක්, සොර සිතක් ආ විට එය ඉවත් කිරීමටද, ඒ වෙනුවට කාරුණික සිතක් ඇතිකර ගැනීමට උත්සාහය අවශ්‍යය. වරදින් මිදීමට හා යහපතෙහි යෙදීමටද ගන්නා ඒ උත්සාහය වීර්යයයි. එය වීරිඉන්ද්‍රියයි.

මෙසේ වීර්ය කළ හැක්කේ නරක සිතිවිල්ලක් ඇතිවන විට එය සිහි වුණොත් පමණකි. මෙය නරක සිතිවිල්ලකි. මෙය හොඳ සිතිවිල්ලකි යනුවෙන් සිහිවීමම සතියයි. එය සතින්ද්‍රියයි.

මේ අයුරින් පුද්ගලයාගේ හැසිරීම සකස් වන්නේ නිවන් අරමුණ ඇතිවය. වරදින්, අකුසලයෙන් සිත මිදෙන විට සිත පිරිසිදු වන විට ඇතිවන එකඟතාව සමාධියයි. එය සමාධීන්ද්‍රියයි.


බුදුරජාණන් වහන්සේ තම ශාස්තෘවරයා ලෙස පිළිගන්නා විට ලෝකය දේව නිර්මාණයක්ය, අප තුළ ආත්මයක් ඇති යන විශ්වාසය බැහැර කරමු. ඒ වෙනුවට මිනිසාගේ ලෝකයේ පැවැත්ම හේතුඵල වශයෙන් සිදුවන බවද යම්තමින් වටහා ගනිමු. සියලු දේ හේතු නිසා හට ගැනෙන බවත්, ඒ හේතු වෙනස් වන විට වෙනස් වන බවත්, ඒ හේතු නැසෙන විට නැසී යන බවත් දූක ගනිමු. මේ දූනීම ප්‍රඥාවයි.

මෙසේ සද්ධා, වීරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම පුද්ගලයා තුළ යම්තමින් ඇරැඹෙයි. ඒ පටන් ගැන්මයි. මේ සංකීර්ණ සමාජයේද, මෙයට වඩා බොහෝ සෙයින් සංකීර්ණ වූ සමාජයකද මේ තත්ත්වය තේරුම් ගෙන ක්‍රියා කිරීමට නුපුළුවන් බවක් නොපෙනේ. පෘතග්ජන බව ඉක්මවා ආර්ය මාර්ගයෙහි පළමු වරට පියවර තබන්නේ මෙලෙසිනි. සැබෑ බෞද්ධකම ඇතිවන්නේ එවිටය.

**ආචාර්ය ධර්මසේන හෙට්ටිආරච්චි**

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

# සිව්සැත්තෑ වියට පා තබන පරමපූජනීය මල්වතු මහනාහිමි



මහා මහින්ද මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් අනුරාධපුර මහා විහාරය ප්‍රතිෂ්ඨාපනය කිරීමත් සමග ප්‍රාරබ්ධ වූ ලාංකේය මහා විහාර වංශික භික්ෂු පරම්පරාව සියවස් ගණනාවක් පුරා නිර්මල ථෙරවාද බුද්ධ ශාසනය මැනවින් පවත්වා ගනිමින් විවිධ වූ ශාසනික සම්ප්‍රදායන් මනාව ආරක්ෂා කරගනිමින් ත්‍රිවිධ ශාසනයම ශෝභාමත් කළ බව නොරහසකි. මෑත මහනුවර රාජධානි සමයෙහි සිදුවූ ශාසනික පරිහාණි අවස්ථාවේදී බෝධිසත්ව ගුණෝපේත වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජෝත්තමයාණන් වහන්සේගේ අනුශාසකත්වයෙන් කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමන්ගේද සහායකත්වයෙන් සියම් දේශාගත ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේ මෙරටට වැඩමවා මල්වතු මහා විහාරයෙහි පිහිටුවන ලද විසුංගාම සීමාවේදී නැතිවී ගිය උපසම්පදා විනය කර්මය නැවත පිහිටුවාලීමත් සමග එකී අනුරාධපුර මහා විහාරයෙන් ආරම්භ වූ මහා විහාරවංශික භික්ෂු පරම්පරාව අඛණ්ඩව ඉදිරියටත් පවත්වාගෙන යාමට අවකාශ සැලසිණි. මෙසේ සියම් දේශයෙන් මෙරටට වැඩමවා ගත් එකී ස්‍යාම දේශීය උපසම්පදාව වනාහි ඈත අනුරාධපුර රාජධානි සමයෙහිදී මෙරටින් සියම් දේශයට වැඩම වූ නිර්මල ලාංකීය මහා විහාර වංශික උපසම්පදාවම වීම මෙසේ මෙරට මහා විහාර භික්ෂු පරපුරෙහි නොකඩ පැවැත්ම සඳහා මූලාධාර වූ බව සඳහන් කළ යුතුය. සියම් දේශාගත උපසම්පදා විනය කර්මය ලක්දිව ආරම්භ කිරීමත් සමග ස්‍යාමෝපාලි මහා නිකායෙහි ආරම්භයත් මල්වතු අස්ගිරි උභය මහා විහාර නම්වූ මෙකී මහා විහාරයීය භික්ෂු මූලස්ථානද්වයෙහි සමාරම්භයත් සිදුවිණි.

මෙබඳු ශ්‍රේෂ්ඨ ඓතිහාසිකත්වයකින් මෙන්ම ප්‍රෞඪත්වයකින්ද සුපෝෂණය වූ අතිසම්භාවිත මල්වතු මහා විහාර පාර්ශ්වයෙහි උත්තරීතර මහානායක පදවිය යනු මෙරට ඇත ශාසනික තානාන්තරයන් අතුරින් වඩාත් සුවිශේෂී වූවකි. වර්තමානයෙහි මෙම උතුම් මහ පදවිය හොබවනු ලබන අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේ මැයි මස 30 වැනි දින ස්වකීය දිවි මගෙහි තෙසැත්තෑ විය සම්පූර්ණ කරන සේක.

උත්තරීතර බුද්ධ භාෂිත ශ්‍රී සද්ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමෙන් අතිශය පූජනීයත්වයට පත්වූ එසේම විවිධ ශාසන භාරධාරී සංඝනේතෘවරයාණන් වහන්සේලාට මෙන්ම ශ්‍රේෂ්ඨ වීරවරයන් සේනාධිපතිවරුන් ආදීන්ට ජාත භූමි වූ ඓතිහාසික මහතලා දනව්වෙහි කොහොන්සිය පත්තුවෙහි තිබ්බටුවාව නම් ග්‍රාමවරයෙහිදී තිබ්බටුවාව වලව්වේ බණ්ඩාරනායක වාසල මුදලි ටිකිරි බණ්ඩාර නිලමේතුමාට සහ කරලියද්දේ ඉඩමේ වලව්වේ ලොකු කුමාරිහාමි යන දම්පතීන්ට දාව වර්ෂ 1944 ක්වූ මැයි මස 30 වන දින අප මහානායක මාහිමිපාණන් වහන්සේ ජන්ම ලාභය ලැබූහ.

වයසින් වැඩෙත්ම ත්‍රිවිධ රත්නය කෙරෙහි අපමණ භක්ත්‍යාදරයකින් යුක්ත වූ මෙම කුලකුමරුවන්ගේ සිත ගිහි ජීවිතයට වඩා පැවිදි ජීවිතය කරා වඩාත් ඇලෙන්නට විය. ඒ අනුව තම දිවියෙහි තෙළෙස් වස සපිරෙත්ම එනම් වර්ෂ 1957 ක් වූ ජූනි මස 10 වැනි දින මහනුවර උපෝෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපතිව වැඩ විසූ අතිගෞරවාර්හ පුරිජ්ජල ශ්‍රී සිද්ධාර්ථ සරණංකරාභිධාන මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ එක් විසිවන මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ හා මල්වතු මහා විහාරාධිවාසී කාරක සංඝසභාන්තර්ගත ගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකරාභිධාන රිදී විහාරාධිපති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේද ආචාර්යත්වයෙන් මල්වතු මහා විහාරයීය රාජකීය මංගල උපෝෂථාගාරයේදී දෙමව්පියන්ගේ මෙන්ම සියලු ඥාති හිතමිත්‍රාදීන්ගේද ආශිර්වද මධ්‍යයෙහි තිබ්බටුවාවේ සුමංගල යන නමින් ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් වූහ.

පැවිදි වීමෙන් අනතුරුව ස්වකීය ආචාර්යයන් වහන්සේලාගේ ඇසුරෙහි මූලික වත් පිළිවෙත් හා බණ දහම් ප්‍රගුණ කළ තිබ්බටුවාවේ සුමංගල සාමණේරයන් වහන්සේ පසුව මල්වතු මහා විහාරයීය ශ්‍රී සංඝරාජ මහ පිරිවෙණට ඇතුළත්ව අතිගරු අමුණුගම රාජගුරු ශ්‍රී විපස්සි මහනාහිමි, අතිගරු විමලකීර්ති ශ්‍රී සුමන පණ්ඩිත සිරිමල්වත්තේ ආනන්ද මහනාහිමි, රාජකීය පණ්ඩිත ගරුතර පහමුණේ ශ්‍රී ගුණානන්ද අනුනාහිමි, මල්වතු මහා විහාරාධිවාසී රාජකීය පණ්ඩිත ගරුතර රත්නින්දේ අනෝමදස්සි නාහිමි ඇතුළු ප්‍රවීණ ඇදුරු මඬුල්ලක් යටතේ ස්වකීය අධ්‍යාපන කටයුතු සාර්ථකව අවසන් කළහ.

අනතුරුව ව්‍යවහාර වර්ෂ 1965 ක්වූ ජූනි මස 10 වැනි දින යථෝක්ත ආචාර්යයන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන් හා මහනුවර උපෝෂථ පුෂ්පෝරාම විහාරද්වයාධිපති අතිගෞරවාර්හ අමුණුගම රාජගුරු ශ්‍රී විපස්‍යාභිධාන මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ මහානායක මහනාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් ඓතිහාසික මල්වතු මහා විහාරයීය රාජකීය මංගල උපෝෂථාගාරයේදී වාහලනාග නාමයෙන් අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි පිහිටුවනු ලැබූහ.

මල්වතු අස්ගිරි උභය මහා විහාරයීය භික්ෂූන් වහන්සේලාට පමණක් පෞරාණික වශයෙන් පැවරෙන භාරදූර වත්පිළිවෙත් අතර ශ්‍රී දංෂ්ට්‍රා ධාතූන් වහන්සේ විෂයෙහි පැවැත්වෙන තේවා කටයුතු ප්‍රමුඛස්ථානයක් ගනී. මහා විහාරයීය සම්ප්‍රදායන් හා චාරිත්‍ර විධි පිළිබඳව මනා අවබෝධයකින් යුක්ත වූ උන්වහන්සේ ස්වකීය පූර්වකෘත පුණ්‍ය බල මහිමය කරණ කොටගෙන 1965, 1979, 1981, 1992 යන වර්ෂවලදී එවකට මහානායක පදවි හෙබවූ මහතෙරවරුන් වහන්සේලාගේ නියමයෙන් එකී ශ්‍රී දළදා මන්දිරයෙහි තේවා ධුරයෙහි කටයුතු කරමින් බුද්ධෝපස්ථානයෙහි යෙදී අපමණ කුසල සම්භාරයක් රැස්කර ගැනීමට තරම් භාග්‍යවන්ත වූහ. එසේම ශ්‍රී දළදා මාලිගාවේ නායක තෙරුන් වහන්සේ වශයෙන්ද කටයුතු කිරීමට තරම් පුණ්‍යවන්තද වූහ.

මල්වතු මහා විහාර පාර්ශ්වයෙහි අනුනායක පදවිය හෙබවූ අතිගරු රඹුක්වැල්ලේ ශ්‍රී ධර්මරක්ෂිත රතනපාල සෝභිතාභිධාන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත්වීමෙන් පුරප්පාඩු වූ එකී අනුනායක පදවියට වර්ෂ 1992 මැයි මස 13 වන දින ගරුතර කාරක මහා සංඝ සභාවේ සමානච්ඡන්දයෙන් තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල නාහිමියෝ තේරී පත්වූහ. ඒ වනවිට උන්වහන්සේ සතළිස් අටවන වියෙහි පසුවූහ.

අනතුරුව අතිගරු රඹුක්වැල්ලේ ශ්‍රී ධර්මරක්ෂිත විපස්සි මහනාහිමිපාණන් වහන්සේගේ අපවත්වීමෙන් පුරප්පාඩු වූ මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ සවිසිවන ශ්‍රීමත් මහනායක පදවියට ගරුතර කාරක මහා සංඝ සභාවේ සමානච්ඡන්දයෙන් වර්ෂ 2004 ක් වූ ජූනි මස 20 දින උන්වහන්සේ තේරී පත්වූහ.

තමන් වහන්සේ වෙත පැවරුණු උත්තරීතර මහානායක පදවිය තුළින් කිසිවිටෙකත් තමන් බබළවා ගැනීමට උත්සාහ නොකළ උන්වහන්සේ නිසා එකී උතුම් පදවිය වඩාත් බැබළීමට පටන් ගත් බව අතිශයෝක්තියක් නොවේ. එකී උතුම් මහ පදවියෙහි වගකීම් හා යුතුකම් මනාව අවබෝධ කරගත් උන්වහන්සේ මල්වතු මහා විහාරයෙහි අභිවෘද්ධිය පිළිබඳව නිරතුරුව සිතමින් ස්වකීය මල්වතු මහා විහාර පාර්ශ්වයට අයත් භික්ෂූන් වහන්සේලාගේ මෙන්ම පෞරාණික සිද්ධස්ථානයන්හි යහපැවැත්ම උදෙසා සුදුසු පරිදි මනාව තීන්දු තීරණ ආදිය ගනිමින් ලක්දිව බුදුසසුන නගා සිටුවීමට මහත් පරිශ්‍රමයක් දරති.

**මල්වතු මහා විහාරවාසී**
**වැලිවිට සරණංකර හිමි**

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

දළදා වරුණ

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## සැබෑ වෙසක් පැතුම

මෙවර බුදු තෙමගුල සැමරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් බුදුපහස ලද අපේ මෙම පුංචි දිවයින තෝරාගැනීම සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවට කරන ලද අතිවිශාල ගෞරවයක් බව අවිවාදිතය. ඒ ගැන අප හදවත් තුළ ඇත්තේ ඉතා නිහතමානී හා අතිපූජනීය හැඟීමකි. ලෝකයේ කිසිම රටක අපේ රටේ තරම් බුදුදහම හා බැඳුණ දර්ශනයක් හා සංස්කෘතියක් දිගු කාලයක් පුරා තිබී නැත. ගිහි පැවිදි සම්බන්ධතාව මෙන්ම දහම හා දර්ශනය සමග එකට පැහුණ නිර්ව්‍යාජ සමාජ රටාව මෙම දිගුකාලීන පැවැත්මට ප්‍රධාන සාධකය වූ බව ඉතාමත් පැහැදිලිය. එය විනාශ වී යාමට ඉඩ නොදී දිවි හිමියෙන් රැකගැනීම අප සියලු දෙනාගේම වගකීම බව අමුතුවෙන් කිවයුතු නැත. මෙහිදී අනිවාර්යයෙන්ම අප කළ යුතු වන්නේ බුද්ධ දර්ශනය නිවැරදිව අවබෝධ කරගැනීමය. අපේ සමහර බෞද්ධයන් බුදු දහම හා බුද්ධ දර්ශනය පටලවාගෙන තිබෙන අයුරක් අද දක්නට තිබෙන අතර එය නිරවුල්ව තේරුම් ගැනීම අතිශයින් වැදගත්ය. වැරදි ධර්ම කරුණු සමාජගත වීමට තිබෙන ඉඩකඩ ඇහිරීම කළ යුතු අතර ඒ සඳහා ජනමාධ්‍යයන්ට ඇති වගකීමද විශාලය.

අද බොහෝ දෙනා කතා කරන්නේ තම අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් පමණි. එහෙත් එම යුතුකම් වෙනුවෙන් ඔවුන් හඬක් නොනැඟීම කනගාටුවට කරුණකි. මෙම සාධකය ගැන 'සිඟාලෝවාද සූත්‍රයෙන්' අපට ගත හැකි පාඩම් හා ආදර්ශයන් බොහෝය. සම්බුද්ධ දේශනාවේ මූලික පදනම, යුතුකම හෙවත් සැබෑ බුද්ධ ධර්මය පදනම් කරගත් උතුම් දර්ශනය බව අපි වටහා ගත යුතුය.

'සියල්ල නැසෙන සුළුය' යන අනිත්‍ය දහම අපි හරිහැටි තේරුම් ගතහොත් ලෝකය මීට වඩා ඉතා සුබදායක වනු නිසැකය. ගැටුම් නිරාකරණය සඳහා නිරවුල් මනසක් පමණක් නොව උපේක්ෂා සහගත දැහැමි චින්තාවක්ද අප තුළ පිහිටිය යුතු අතර එය ප්‍රායෝගිකව ක්‍රියාවටද නැංවිය යුතුය. පිරිපුන්, පින්බර ජීවිතයක් ගත කරන්නට නම් අපි සියලු දෙනාම බුදුරජාණන් වහන්සේගේ නිර්මල බුද්ධ දර්ශනය අනුවම ජීවිතය හැඩ ගස්සවා ගන්නට අදිටන් කරගත යුතු වෙමු.

බුදු තෙමගුල සරමන වෛශාඛ්‍ය මංගල්‍යයේ සැබෑ ප්‍රාර්ථනාව විය යුත්තේ එයයි. ■

# වසර 203 ක් ගතවී ...
## තවමත් ලක් මතකයෙන් අමත...
## ඇහැලේපොල කුමාරිහා...
# දිරිය මාතා...



මෙම නාමය ලක්වැසි ජනතාවට ආදර්ශයක් වෙමින් වසර සියවස් ගණනාවක් තවත් බොහෝ කල් පවතින්නකි. එයට හේතු වන කරුණු කාරණා ගණනාවක් ඇත. වසර 1814 කාලසීමාව අපේ රටේ රාජ්‍යත්වය මෙන්ම සාමාන්‍ය ජනයා පවා උඩුයටි කරවීමට සමත් වූ කාල වකවානුවකි.

මේ පිළිබඳව විමසා බැලීමේදී මූලික වශයෙන් කෙනෙක් ජීවත් වූ පරිසරය සොයා බැලිය යුතුය. වසර 1798-1815 කාලය තුළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු යටතේ අධිකාරම් ධුරය දරූ නිළමේ කෙනෙකි ඇහැලේපොල නිලමේ. මොහුගේ නම 'ඇහැලේපොල සෙනෙවිරත්න සේනානායක චන්ද්‍රතිලක විජේසුන්දර දිසානායක අමරකොන්වාහල පණ්ඩිත මුදියන්සේ' යනුයි.

මහවෙල පොල්වත්ත විහාරස්ථානයෙන් ලැබෙන තොරතුරු අනුව එම භූමිය වර්තමානයේ විහාරස්ථානයක් වුවද පෙර දවස ඇහැලේපොල වලව්ව පිහිටියේ එහිය. මෙහි ජීවත් වන වකවානුව තුළ ඇහැලේපොල නිළමේ විවාහ දිවියට එළඹෙන අතර පළමු විවාහයේ දරුවන් බිහිවීමට යාමේදී එම කුමරිය දරුවා සමග මරණයට පත්වන අතර දෙවන විවාහයේදීද සිදුවන්නේ එම ඉරණමය. ඇහැලේපොල ගමේ උපන් ඇහැලේපොල කුමාරිහාමි සමග විවාහ දිවියට එළඹෙන ඇහැලේපොල නිළමේ ඇයට දාව පළමු දරුවා ඉපදීමේදී දරුවා මරණයට පත්වීමත් සමග කම්පනයට පත්ව සියලු දේපොළ සහ ඇහැලේපොල වලව්ව අස්ගිරි මහා විහාරයට පූජා කර ඇහැලේපොල කුමාරිහාමිගේ උපන් ගම වන ඇහැලේපොල ගමේ වලව්වේ ජීවත් වෙති. ජනප්‍රවාද තොරතුරු අනුව පැරණි පොල්වත්තේ පිහිටි ඇහැලේපොල වලව්වේ කිරි දරුවන් හඬන ශබ්දය මෑතක තෙක් ඇසී ඇත.

ඇහැලේපොල ගමේ ජීවත් වන කාලය තුළදී මහනුවර රජ මාළිගයෙන් ලැබෙන ආරාධනාවකට අනුව සත්කෝරළයේ දිසා ධුරය ඇහැලේපොල නිළමෙට ලැබෙයි. කාර්යශූර අයෙක් ලෙස එහි කටයුතු කිරීමේදී 1808 දී වීගස්තැන්නේ අදිකාරම්ගේ මරණයෙන් පසු උඩුගම්පහේ අදිකාරම් වශයෙන් මොහු පත්කරනු ලැබීය. 1814 වකවානුවේදී සබරගමු දිසාපති ධුරයට පත්කරන ඇහැලේපොල මහ නිලමේ ජනතාවගේ ප්‍රසාදය දිනා ගනිමින් කටයුතු කරගෙන යන අවස්ථාවේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් පසු ඇහැලේපොල නිලමේ රාජ්‍යත්වයට පත්වේදැයි යන සැකය මොල්ලිගොඩ නිලමේ තුළ ඇතිවෙයි.

තත්ත්වය මෙසේ තිබියදී මහනුවර පිහිටි ඇහැලේපොල වලව්වේ සිටි ඇහැලේපොල කුමාරිහාමිට මොල්ලිගොඩ අයුතු යෝජනා සිදුකලා

යැයිද
ජනප්‍රවාදයේ පව...
ප්‍රතිපත්ති ධර්මයෙ...
ඉහළ තත්ත්වයක...
රත්නය ඒ සියල්ල...
කැපවෙමින් එඩිත...
මොල්ලිගොඩ...
පළි ගැනීමට නෙ...
බවත් මොනවට...
වාසල සඳහා එව...
ආදායම් අතරමග...
මොල්ලිගොඩ රජු...
එවනු ලබන සන්...
මනාප සේ සකස...
රජුට පක්ෂපාතී...
ඇහැලේපොල රැ...
ඔටුන්නක් සහ ක...
ලවා සාදන අවස...
රජවීම සඳහා බව...
මෙයින් දැඩි කෝ...
පාලනය කරන ප්‍ර...
පීඩාවට පත් කර...
උපක්‍රම තුළින් ප...
නිසා මොහුට සිදු...
පැතීමය. බ්‍රිතාන...
දිනා ගැනීමට නෙ...
අල්ලාගෙන සිටි...
ගැනීමට කදිම අ...
මෙයින් කෝ...
රජු පළිගැනීමට...
ඇහැලේපොල ...
සහ ගුණ දහම් ...

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙ...

...තත්
...නොවූ
...ම් නම් වූ

...ා කුලමානයෙන් ඉතා
... වන මෙම කාන්තා
...කලා දරුවන් සඳහා
...ා නිර්භීතව ජීවත් වෙයි.
...ැලේපොල නිලමේගෙන්
...ත් උපක්‍රම භාවිත කරන
...යයි. මහනුවර රජ
...න සබරගමුවේ
...ල්ලකෑමට පෙළඹෙන
...ා සබරගමුවෙන්
...වෙනස් කර තමන්ට
...ාසල කරා එවයි.
...කටයුතු කරන
...ානය කිරීම සඳහා
... සබරගමුවේ ශිල්පීන්
...මෙය ඇහැලේපොල
...ා රජු නොමග හරියි.
...ත්වන රජු ඇහැලේපොල
...ට මරාල බන්ද නමින් මිනිසුන්
...ද්දක් අයකරයි. මොල්ලිගොඩගේ
...ැලේපොල පසුපස පැන්නීම
...න් බ්‍රිතාන්‍යයන්ගේ පිහිට
... මොහු තමන්ගේ අභිලාෂයන්
...අවස්ථාවකි. මුහුදුබඩ ප්‍රදේශ
...ව උඩරට ප්‍රදේශය අල්ලා
...කි.
...ට වන ශ්‍රී වික්‍රම රාජසිංහ
... ගත්තේ දරුවන් සහිත
...මිය. කුමාරිහාමිගේ කුලත්වය
...මේ අදහසින් රොඩියකුට පාවා

දීමට සූදානම් වෙයි. මෙය තරයේ ප්‍රතික්ෂේප කිරීම නිසා දරු පවුල පිටින් විනාශ කිරීමට කටයුතු යොදයි.

අතීතයේ පටන් ලක්දිව සටන් සඳහා සුප්‍රසිද්ධියක් උසුලනු ලබන්නේ මාතලේ ප්‍රදේශයයි. ඇහැලේපොල කුමාරිහාමිගේ සහ කැප්පෙටිපොල දිසාවගේ උපන් ගම වන්නේ මාතලේ උඩසිය පත්තුවේ උඩුගොඩ මොනරවිලය. මෙම ගම්පියස තුළ හැදුනු වැඩුණු ඇහැලේපොල කුමාරිහාමි තමන්ගේ අභිමානය සහ නිර්භීතකම් උප්පත්තියෙන්ම ලැබුණා වන්නට පුළුවන. ඇහැලේපොල නිලමේ ඉංග්‍රීසීන් හා එක්වීම ගැන කෝපාවිෂ්ට වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඔහුගේ නෑදෑයන් ඇපකාරයන් වශයෙන් සිර කිරීමට අණ කළේය. රාජද්‍රෝහියකු පැන ගියහොත් ඇපකරුවන් හට දඬුවම් කිරීම එකල සිරිත විය. ඇහැලේපොල ඉංග්‍රීසීන් හා එක්ව තමාට විරුද්ධව සටනට සැරසෙන බව දුන කෝපාවිෂ්ඨ වූ රජ ඇහැලේපොල නිලමේගේ ඥාතීන්ට දඬුවම් කිරීමට සූදානම් විය. ඇහැලේපොල කුමාරිහාමි සහ පුස්සැල්ලේ කුමාරිහාමි සහ ඔවුන්ගේ දරුවන් රජුගේ අණ පිට වධකාගාරයට ගෙනෙනු ලැබීය.





පිරිමින්ගේ හිස ගසා දැමීමටත්, ස්ත්‍රීන් දියේ ගිල්වා මැරීමටත් එහි සිටි රජ අණ කළේය. කුඩා දරුවන්ගේ හිස ගසා දැමීම ළය කම්පා කරන සිද්ධියක් විය.

වධකයා දැක භයෙන් තැති ගත් වැඩිමහලු කුමරු පසුබසින විට භය නොවී මරණයට මුහුණ දීමට ඇහැලේපොල කුමාරිහාමි ඔවුන් ධෛර්යමත් කළ බව කියති. එසේ ධෛර්යමත් වූ මද්දුම බණ්ඩාර කුමරා වධකයාට ගෙල පෑ හැටි අද වනවිට සිංහලයන් අතර ගෞරවයෙන් සිහිපත් කිරීමක් දක්නට ඇත. වැඩිමහලු දරුවන්ගේ ගෙල සිඳ දැමූ වධකයා කිරි උරමින් සිටි අත දරුවා බලෙන් ගෙන ඒ කුඩා දරුවාගේ ගෙලද කැපීය.

රජු දරුවාගේ හිස වංගෙඩියක ලා ඇහැලේපොල කුමාරිහාමි ලවා කෙටවීමට නියම කළ බව සඳහන් විය. මෝල්ගස ගෙන වංගෙඩිය තුළට ඇතුළි කරත්ම ඇයට සිහිය නැතිවී ඇද වැටුණු බව ඇතැම් අය සඳහන් කරති.

අනතුරුව ඇහැලේපොල කුමාරිහාමි සහ පුස්සැල්ලේ කුමාරි සහ ඇගේ දියණියන් බෝගම්බර වැවේ ගිල්වා මැරීමට රජු අණ කළේය. මෙම සිද්ධිය මුළු සෙන්කඩගල පුරවරයම කම්පා කරවන සිද්ධියක් විය. දින ගණනාවක් ගෙදරක ගින්දර ටිකක්වත් නොදැල්වූ බව ජනතාවගේ මතයයි.

මෙම සිද්ධි දාමය සිදුවී වසර 203 ක් ගතවී ඇතත් මේ අවස්ථාවේ මා දළදා මාලිගාවේ තේවාවේ නිරතව කටයුතු කරන අතර මෙම භූමිය පිළිබඳ පරීක්ෂා කර බැලුවෙමි. මහා විෂ්ණු දේවාලයටත්, නාථ දේවාලයටත් අතර ඇති කුඩා තන පිටියක් ඇත. දැනටද මේ කොටස උසුලන්නේ දැඩි පාළු ස්වභාවයකි. 2017 මාර්තු 1 වන දින 1818 මහ කැරැල්ලට සම්බන්ධ වන රණවිරුවන් රාජ ද්‍රෝහීත්වයෙන් නිදහස් කිරීමක් මඟුල් මඩුවේදී සිදුවිය. එම අවස්ථාවේ හිමිනමකගේ විජිනි පතෙහි කැප්පෙටිපොල මහ නිලමේතුමගේ ඡායාව සටහන් වී තිබුණි. ඇහැලේපොල කුමාරිහාමිගේ සේයාවද මේ පරිසරය තුළ ඇතැයි සිතීමට පුළුවන.


රජුගේ කෝපය, වෛරය ඇහැලේපොල සම්බන්ධ උඩරට ප්‍රභූ පවුල්වලට සෘජුවම බලපෑහ. ඇහැල ගස් පවා කපා දැමීමට අණ කළේය. මෙයින් තැති ගැනීමට පත් ප්‍රභූ පවුල්වල අය ආරක්ෂිත ප්‍රදේශ සොයා නොයෙකුත් පළාත්වලට පිටත්ව ගියහ. ඒ සඳහා වලපනේ, කොහොන වියනකාලබඩ, දඹුල්ල, ලග්ගල ආදී ප්‍රදේශ තෝරාගෙන ඇත. ලග්ගල ගඟල උඩසිය, පල්ලෙ සිය වශයෙන් කොටස් දෙකක් ඇත. ගඟල පල්ලේසියපත්තුවට අයත් වූ ජන කොටස් එදා භාවිත කොට ඇත්තේ ගඟල යනවා යන අදහසයි. මෙසේ කැලෑබද ප්‍රදේශ තෝරාගෙන ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ඔවුන් ගෙන ආ පිරිස් ස්ථාන ගත කොට නැවත ඉංග්‍රීසීන් හා සම්බන්ධ සටනට සූදානම් වූ බවත් ප්‍රදේශ ගවේෂණයේදී තහවුරු වෙයි. මෑතක් වන තෙක් ඒ ගම්වලට අයත් ඉතිහාසය පොතපතකට පවා ඇතුළත් වූ බවක් දක්නට නැත.

ලග්ගල ගඟල පල්ලේසිය පත්තුවේ නාවුල ගල්බොඩ නම් ග්‍රාමයක් ඇත. 1970, 1980 ගණන්වල පවා ඔවුන්ට අවශ්‍ය වූයේ භූමිතෙල් සහ ලූණු පමණි. අනිත් සියල්ල ගමෙන් සපයාගෙන ඇත. ඔවුන්ගේ පරම්පරා සොයා බැලීමේදී පෙනී යන්නේ මහනුවර හා සබඳතා සෘජු ලෙස පැවැති බවයි. වර්තමානයේ පවා මුල්ලේගම මහනිලමේ සුදුහුම්පොල ගෙදර ආදී පරම්පරාවල මිනිසුන් අදටද මේ ගමේ ජීවත් වෙයි. ලෝරිගේ ගැසට් එකට අනුවද ගල්බොඩ කොහොන, මොරගස්පිටිය වියනකාලමඩ ආදී ගම් ගැනද සඳහන් වී ඇත.

මෙයින් පෙනී යන්නේ මහනුවර රාජධානිය උඩු යටිකුරු කිරීමට හේතුව වූ ඇහැලේපොල කුමාරිහාමිගේ ඛේදවාචකය ලක්දිව ඉතිහාසයෙන් කෙදිනකවත් අමතක කිරීමට නොහැකි බවයි.

**ශාස්ත්‍රපති, ගල්බොඩ සිද්ධත්ථ ස්ථවිර**
**ඓතිහාසික ගැටඹේතොට, මහනුවර.**

"...ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



## මහණෙනි... සියලු සංස්කාර ධර්මයෝ

# නැසෙන සුළුයි

## නොපමාව කුසල් දහම්හි යෙදෙන්න

## බුදුරජුන් මරණ මංචකයේ සිටියදී එසේ කීවේ ඇයි?

අසූ වැනි වියට පැමිණි බුදුරජාණන් වහන්සේගේ ජීවිතයෙහි අවසාන කාලය උදාවිය. සිය අවසන් වස් කාලය ගතකිරීම සඳහා විශාලා පුරයට වැඩම කළ උන්වහන්සේට ලේ අතීසාර රෝගය (ලෝහිත පක්ඛන්දිකා) වැළඳුණි. අධිෂ්ඨාන බලය හා චිත්ත ශක්තිය නිසා රෝගය යටපත් කරගෙන සුවපත් වූ බුදුන් වහන්සේට ආනන්ද හාමුදුරුවෝ ''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සුවපත් වූ බව දුන මා තුළ මහත් සතුටක් ඇති විය. ඔබවහන්සේ, අන්තිම අවවාදය භික්ෂූන්ට දේශනා කොට මිස පිරිනිවන් පාන්නේ නැතැයි මම බලවත් විශ්වාසයෙන් සිටියෙමි'' යනුවෙන් පැවැසූහ.

එවිට බුදුන් වහන්සේ අනඳ හිමියන්ට මෙසේ වදාළහ. ''ආනන්ද, මා ළඟ ගුරුමුෂ්ටියක් ඉතිරිව නැත. මම වටහා ගත් ධර්මය භික්ෂු සංඝයාට නොසඟවා දේශනා කොට ඇත්තෙමි. භික්ෂු සංඝයා මගෙන් කුමක් දුනගනු කැමැත්තෝද, ඔවුන්ගේ නායකයා හෝ පාලකයා වීමේ කැමැත්තක් මා තුළ නොවීය. එනිසා අවසාන වශයෙන් දේශනා කිරීමට ඉතිරි කරගත් දෙයක් මා ළඟ නැත. මහණෙනි, තමාම තමාට පිහිට කොටගෙන, තමාම තමාට සරණ කරගෙන වාසය කරන්න. (අත්තදීපා විහරථ, භික්ඛවේ අත්ත සරණා, අනඤ්ඤ සරණා) එසේම මහණෙනි, ධර්මයම පිහිට කරගෙන, ධර්මයම සරණ කරගෙන ජීවත් වන්න. (ධම්ම දීපා විහරථ භික්ඛවේ ධම්ම සරණා, අනඤ්ඤ සරණා) යනුවෙන් වදාළහ.

බුදුරජාණන් වහන්සේ නිවීම හා මිදීම පිණිස මග කියා දුන් ශාස්තෘවරයකු විනා ගලවා ගන්නා සර්ව බලධාරී දෙවියකු හෝ බ්‍රහ්මයකු හෝ නොවූහ. පුද්ගලයාගේ විමුක්තිය වෙනත් කිසිවකුට අද්භූත ලෙස, ඉන්ද්‍රජාලික ලෙස ලබාදිය නොහැකි බව මැනවින් පැහැදිලි

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

කළ උන්වහන්සේ, තමන්ට කළ හැක්කේ ඒ සඳහා මග කියාදීම පමණක් වන අතර විමුක්තිකාමී කවරකුට වුවද ඒ මග අනුගමනය කිරීමෙන් නිවන පසක් කරගත හැකි බව පැහැදිලි කර දුන්නේය. (තුම්හේහි හිච්චං ආතප්පං, අක්ඛාතාරො තථාගතො) තම ශ්‍රාවක පිරිසට නිදහස්ව, ස්වාධීනව ජීවත් වීමට මග පෙන්වා දුන් උන්වහන්සේ බුද්ධ ශාසනය දිගුකල් පැවැත්ම හා භික්ෂු සංඝයාගේ මනා සංවරය පිණිස අවශ්‍ය වූ අවස්ථාවල පමණක් විනය නීති පැනවූහ. මෙතරම් පුද්ගල ස්වාමීත්වයට, ස්වඡන්දතාවට, නිදහස මතිකත්වයට අවකාශ සැලසූ වෙනත් ශාස්තෘවරයකු ලොව පහළ වී නැති තරම්ය.

මහණෙනි, භාග්‍යවතුන් වහන්සේ වෙතින් මෙය අසන ලදැයි කී පමණින් නොපිළිගෙන තථාගතයන් දෙසූ ධර්ම විනයට ගැළපේදැයි විමසා බලා ගැළපේ නම් පමණක් පිළිගැනීම මැනවි... ආදී වශයෙන් දේශනා කළ ''සතර මහාපදේශ, කාලාම සූත්‍රය'' වැනි දේශනාවලින් ඒ බව සනාථ කරගත හැකිය.

සැවැත්නුවර බලා වැඩම කළ බුදුරජාණන් වහන්සේ තම පරිනිර්වාණය තවත් සිව් මසකින් අනතුරුව සිදුවන බව ප්‍රකාශ කළහ. ඒ පුවත ඇසීමෙන් කම්පාවට පත්වූ පුහුදුන් භික්ෂූහු එතෙක් තමනට මාර්ගඵලාවබෝධය ලැබීමට නොහැකි වීම ගැනත්, තම ශාස්තෘවරයා නැවත දැකීමට නොලැබීම ගැනත් මහත් සේ කම්පාවට පත්ව හඬා වැළපෙන්නට වූහ. රහතන් වහන්සේලාට ලෝක ස්වභාවය පිළිබඳව ධර්ම සංවේගය පහළ විය. සියලු භික්ෂූහු කුමක් කරමෝදැයි තැනින් තැන මුළු මුළු වී සිටින්නට වූහ. එහෙත් ''ධම්මාරාම'' නම් තෙරණුවෝ, ''බුදුරදුන් වැඩ සිටින සමයේම රහත් වෙමි'' යි සිතා හුදෙකලාව සිටිමින් ධර්මය ආවර්ජනය කරන්නට වූහ. ඒ බව දුටු සෙසු භික්ෂූහු බුදුරජාණන් වහන්සේ වෙත ගොස් ''ස්වාමීනි, ධම්මාරාම තෙරුන් තුළ ඔබවහන්සේ පිළිබඳ අල්පමාත්‍ර වූද ස්නේහයක් නැත. අප හැමදෙන ඔබවහන්සේගේ වියෝගය සිහි කොට හඬා වැළපෙද්දී ඔහු පමණක් හුදෙකලාව වෙසෙයි'' යැයි පැවැසූ විට ඒ හිමියන් කැඳවා කරුණු විමසද්දී, ධම්මාරාම තෙරණුවෝ තම අභිප්‍රාය ප්‍රකාශ කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ සාධු නාද දී මෙසේ වදාළහ.

''මහණෙනි, මට ස්නේහ ඇති තවත් වෙනත් භික්ෂුවක් ඇත්නම් ඔහුත් ධම්මාරාම භික්ෂුව මෙන් විය යුතුය. මල්, සුවඳ ආදියෙන් මා පුදන්නෝ මට පූජා කරන්නෝ නොවෙති. ධර්මානුධර්ම ප්‍රතිපත්ති පිළිපදින්නෝම සැබවින් මා පුදන්නෝ වෙති.''

''භික්ඛවේ, අඤ්ඤෙනාපි මයි සිනේහවන්තේන භික්ඛුනා ධම්මාරාම සදිසේනේව භවිතබ්බං, නහි මය්හං මාලාගන්ධාදිහි පූජං කරොන්තා පූජං කරොන්ති නාම ධම්මානුධම්මං පටිපජ්ජන්තා ඒව පන මා පූජෙන්ති නාම.''

බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේදීම සැරියුත් මුගලන් අගසව් දෙනමද පිරිනිවන් පා වදාළහ. තමන් වහන්සේද තව තුන් මසකින් පිරිනිවන් පාන බව ආනන්ද හිමියන්ට පැවැසූ බුදු හිමියෝ මහා වනයෙහි කූටාගාර ශාලාවට වැඩියහ. එහිදී හාත්පස වැඩ සිටින සියලු භික්ෂූන් උපස්ථාන ශාලාවට රැස්කරන ලෙස අනඳ හිමියන්ට දැනුම් දුන්හ. භික්ෂූන් එහි රැස්වූ පසු උපස්ථාන ශාලාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේ, සප්ත බෝධිපාක්ෂික ධර්ම මනාව ඉගෙන පුරුදු, පුහුණු කරන ලෙස උපදෙස් දී මෙසේ වදාළහ.

''මහණෙනි, ඔබ හැමදෙනාටම කරුණාවෙන් පවසමි. සියලු සංස්කාරයෝ නැසෙන ස්වභාව ඇත්තෝය. එළැඹ සිටි සිහි ඇතිව ගුණ දම් වඩව්. ළඟදී තථාගතයන්ගේ පිරිනිවීම වන්නේය. මෙයින් තුන් මසක් ගිය තැන තථාගතයන් පිරිනිවෙන්නේය.''

(''හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වො, වයධම්මා සංඛාරා, අප්පමාදේන සම්පාදේථ, නචිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති ඉතො තිණ්ණං මාසානමච්චයේන තථාගතෝ පරිනිබ්බායිස්සති.'')

මේ සමයෙහිම ප්‍රජාපතී ගෝතමී සහ යශෝධරා යන තෙරණිවරු දෙදෙනාද පැමිණ බුදුන් වහන්සේ දැක අවසර ගෙන පිරිනිවන් පෑහ. බුදුරදුන් විසින් මැඩපවත්වා ගන්නා ලද රෝග තත්ත්වය ''බේලුව'' ගමට වැඩිය පසුව යළිත් මතුවිය. එම අවස්ථාවෙහි බුද්ධ ශරීරය පවා රෝග පීඩාවනට ගොදුරු වන බව ආදර්ශයෙන් පෙන්වා විශිෂ්ට ස්වභාවය සිය ශ්‍රාවකයන්ට අවබෝධ කරවන්නට සිතූ උන්වහන්සේ රෝගය එසේම පවතින්නට ඉඩ හැරියහ.

අනුක්‍රමයෙන් මග ගෙවා කුසිනාරා පුරයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ මල්ල රජුන්ගේ ''උපවර්තන'' නම් සල් උයනට වැඩම කොට, එහි සල් රුක් දෙකක් අතර අනඳ තෙරුන් විසින් පනවා දෙන ලද සයනයෙහි සැතපුණු සේක. එවිටද දෙව් බඹුන් විසින් පවත්වන ලද පුද පෙළහර දුටු භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා, ආමිස පූජා මාත්‍රයකින් පිදීම තථාගතයන් වහන්සේට කරන නිසි ගරු බුහුමන නොවන බවත් යම් භික්ෂුවක් හෝ මෙහෙණියක හෝ උපාසකයකු හෝ උපාසිකාවක නව ලෝකෝත්තර ධර්මයට අනුධර්ම වූ ප්‍රතිපත්ති අනුගමනය කරමින් වාසය කළ හොත් ඒ පුද්ගලයා නිසි උතුම් පූජාවෙන් තථාගතයන් පුදන්නකු බවත් වදාරා අවවාද කළ සේක. අනතුරුව අනඳ තෙරුන් වහන්සේ විසින් විමසන ලද ප්‍රශ්නවලටද පිළිතුරු දී සිය වියෝව පිළිබඳ වැළපුණු උන්වහන්සේට, ''ආනන්දයෙනි, නොහඬන්න, ශෝක නොකරන්න, සෑම ප්‍රියමනාප දෙයින් වෙන්වීම කලින්ම මා කීවා නොවේද? හැදුණු දෑ කැඩෙන බිඳෙන සුළුය. එසේ කළ එය පලුදු නොවේවායි සිතා ඒ පෙරළීම වළක්වන්නට කිසිවෙකුටත් නොහැකිය. එබැවින් පමා නොවව්. නොබෝ කලකින්ම තෙපි රහත් බව ලබන්නාහුය'' යනුවෙන් වදාරා සිත සැනසූ සේක. සුභද්‍ර නම් පිරිවැජියා ඒ අවස්ථාවෙහි තම සැක දුරුකර ගැනීම සඳහා භාග්‍යවතුන් වහන්සේ හමුවීමට කැමැති බව දන්වූ විට අනඳ තෙරණුවෝ එය ප්‍රතික්ෂේප කළහ.



එහෙත් බුදුන් වහන්සේ ඔහුට ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබාදුන් පසු:

''පූර්ණ කාශ්‍යපාදී තීර්ථකයන් තමන් ප්‍රතිඥා කළ පරිදි දුකින් මිදීමට මාර්ගය දත්තෝද? ඔවුන්ගේ ධර්මය නෛර්යාණිකද, නැද්ද'' යි විචාළේය. එවිට බුදුන් වහන්සේ ''ඔවුන්ගේ කරුණු අහක තිබේවා. මම ඔබට ධර්මය දෙසන්නම්. එය අසා සිත තබාගන්නැ'' යි ධර්මය දේශනා කළහ. එසේම ''සුභද්‍රය, සෝවාන් ආදී සතර ඵල පිණිස විදසුන් වඩන සිව් දෙනාද, මාර්ගස්ථ සිව්දෙනාද, ඵලස්ථ සිව්දෙනාදැයි මෙකී දොළොස් ශ්‍රමණයන් නැති අන්‍ය දෘෂ්ටීන් හිස්ය, තුච්ඡය. මේ දොළොස් ආකාර භික්ෂූහු රිසි සේ වසන්නම්. ඒ සෝවාන් ආදීහු අන්‍යයනයටද තමන් ලත් මාර්ග ඵලාදිය කියා දී තවත් මාර්ගස්ථ පුද්ගලයන් ඇති කරන්නට තැත් කරත් නම්, ''ලෝකය රහතුන්ගෙන් හිස් නොවෙන්නේය'' යනුවෙන්ද වදාළහ. ධර්මය අසා පැහැදුණු සුභද්‍ර පැවිද්දා උපසම්පදාව වඩා එහිදීම විදසුන් වඩා රහත් වී බුදුරදුන්ගෙන් පැවිදි උපසම්පදාව ලත් අන්තිම ශ්‍රාවකයාණෝ වූහ.

ඉක්තිබි අනඳ තෙරුන් අමතා තමන් වහන්සේගේ ඇවෑමෙන් ධර්ම, විනය දෙක ශාස්තෘ වෙතැයිද, පැවිද්දන් සිය වැඩිහිටියන්ට ගරු බුහුමන් කරමින්, වාද්ධ පටිපාටිය රකිමින් සසුනෙහි පැවැතිය යුතු යැයිද අවධාරණය කොට මෙසේද වදාළහ.

**''මහණෙනි, සියලු සංස්කාරයෝ නැසෙන සුළු වෙති. එබැවින් එළැඹ සිටි සිහියෙන් සියලු පැවිදි කිස සම්පූර්ණ කරව්.''**

මෙය බුදුරජාණන් වහන්සේගේ අන්තිම වචනය විය. අනතුරුව සිය උපතින් අසූවන වියෙහි වෙසක් පසළොස්වක් දින අලුයම්හි අරුණ නැගෙන්නට පෙර, චතුර්ධ්‍යානයෙන් නැගී සිට, සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාවට තමන් වහන්සේද ආදර්ශ කරමින් නිරුපදිශේෂ පරිනිර්වාණයෙන් පිරිනිවන් පා වදාළ සේක. එසේ වුවද ඒ ගෞතම බුදුරජාණන් වහන්සේගේ ධර්මය දකින කවරකුට වුවද ජීවමාන බුදුරජාණන් වහන්සේ දැකිය හැකිය. ලක්ෂ සංඛ්‍යාත ගණනින් රොද බැඳ ගුණ ගී ගයමින් ආමිශ පූජාවෙහිම ඇලී ගැලී සිටිනවාට වඩා ධර්මානුගත ප්‍රතිපත්තියෙහි යෙදෙන්නේ නම් අදත් නිවන් සුවයෙන් නිවී සැනසිය හැකිය. ඒ බුද්ධ පරිනිර්වාණය සිදුවුවත් තථාගත ධර්ම පරිනිර්වාණය සිදුවී නැති බැවිනි.

**දර්ශන රත්නායක - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

United Nations Day of
VESAK
2561 B.E./2017 SRI LANKA

# ආලෝ දහම...

◀ 09 වැනි පිටුවෙන්

**❒ ඔබ අතින් නිර්මාණය වුණ වෙනත් ලාංඡන සහ නිර්මාණ මොනවාද?**

පොදුරාජ්‍ය මණ්ඩල සමුළුවේ සහ පොදුරාජ්‍ය මණ්ඩල මහජන සමුළුවේ නිල ලාංඡනය නිර්මාණය කිරීමේ අවස්ථාව හිමිවුණේ මටයි. ශ්‍රී ලංකාවේ පැවැති ජාත්‍යන්තර ක්‍රිකට් තරගාවලි කිහිපයකම නිල නිල ලාංඡනයන් නිර්මාණය කිරීමේ අවස්ථාව මට හිමිවුණා.

අධිවේගී මාර්ගයේ පිවිසුම් දොරටුව නිර්මාණය කිරීම මෙන්ම සංචාරක හෝටලය ඇතුළු අප රටේ වාස්තු විද්‍යා නිර්මාණයන් බොහොමයක් සඳහා මගේ නිර්මාන දායකත්වය සපයා තිබෙනවා.


**❒ මේ කෙටි කාලය තුළ ලබාගත් අනෙකුත් ජයග්‍රහණ මොනවාද?**

2006 වසරේදී පැවැති පොන්ඩ්ස් බොඩි බියුටිෆුල් ජාත්‍යන්තර ප්‍රදර්ශනයේ හොඳම වෙළෙඳ කුටියට හිමි සම්මානයත් ලැබුණේ මටයි.

**❒ කවුද ඔබට උදව් කළ පිරිස?**

පාසල් අවදියේදී ගුරුවරුන් මගේ හැකියාවන් දැකලා මාව උනන්දු කළා. ඔවුන් මගේ අනාගතේ ගැන ඉඟි පහළ කළා. පැල්මඩුල්ල ධර්මාලෝක විද්‍යාලයේ ගාමිණී මුහන්දිරම් ගුරුතුමා, විදුහල්පතිවරුන් වන එම්. කේ. විජේතිලක සහ රත්නසිරි පතිරණ මහත්වරුන්, බුත්තල දුටුගැමුණු විද්‍යාලයේ ගරු විදුහල්පති දයානන්ද මහතා ඒ අතරින් සිහිපත් කරන්නම ඕනෑ. මට තවත් දුර ගමනක් යන්න තියෙනවා.

**ජගත් ජයසිංහ ශිල්පියාගේ ලිපිනය:**
**12ඒ/4, විශ්වවිද්‍යාල පාර, රත්තනපිටිය.**
**දුරකථන අංකය: 071 4415990**






# ග්‍රහ අපල යනු මොනවාද?


ජ්‍යොතිෂයේ ග්‍රහ අපල යනුවෙන් හඳුන්වන්නේ ජීවිතයට බලපාන අයහපත් කටුක කාලපරිච්ඡේදයන් හා අසුබ සිදුවීම්ය. මේවා ග්‍රහයන් විසින් ඇති කරන බව පැවසුවත් සැබෑ ලෙසම අපල හෙවත් අයහපත් දුක්ඛිත විපාක ඇති කරන්නේ පූර්ව කර්ම විපාක මූලික වීමෙනි. එනම් ඔබගේ පූර්ව අකුසල් මෙලොවදී විපාක දෙන කාලවකවානු හා අනිටු සිදුවීම් ජ්‍යොතිෂයෙහි දක්වනු ලබන්නේ ග්‍රහ අපලයක්, ග්‍රහ අපල කාලයක් වශයෙනි. නමුත් මෙය ග්‍රහයන් විසින් ඔබට සිදුකරන අනර්ථයන් නොව ඔබේ පූර්ව අකුසල ඔබට විපාක දෙන ආකාරයයි.

නිදසුනක් ලෙස ඔබේ කේන්දරයේ සිකුරු දුර්වල නම්, පාප පීඩිත නම් විවාහය ප්‍රමාදවීම, විවාහ නොවීම, විවාහය බිඳ වැටීම, ලෞකික සැප සම්පත් විඳීමට අවස්ථාව අඩුවීම වැනි විපාක ඇති කරනු ලැබේ. එය සිකුරු විසින් ඔබට කරන දෙයක් නොව ඔබ විසින් පූර්වයෙහි කරන ලද කාමයේ වරදවා හැසිරීම, පවුල් කඩාකප්පල් කිරීම, කාලත්‍රයාට පීඩා කිරීම, අනුන්ගේ සැපත බාධා කිරීම වැනි අකුසල්වල විපාකයි. ඔබේ මෙම කර්ම විපාකය ජ්‍යොතිෂයෙහි හඳුනාගනු ලබන්නේ සිකුරු දුර්වල වීම තුළිනි. එහෙයින් එය සිකුරු විසින් ඇති කරනු ලබන අපලයක් යැයි සඳහන් කළත් සැබැවින්ම එය ඔබ විසින් පෙර කරන ලද අකුසලයකි. මෙසේ විවිධ කරුණුවලට විවිධ ග්‍රහයන් මුල්වන නමුත් අපල නම් පූර්ව අකුසලවල විපාකම වේ. දැන් ඔබට ග්‍රහ අපල පිළිබඳ සැලකි යුතු අවබෝධයක් ලැබී ඇත.

මෙසේ ජ්‍යොතිෂය තුළින් පූර්ව අකුසලය හඳුනාගෙන එය සමනය කිරීමට අවශ්‍ය කුසල් සම්පාදන කටයුතු ශාන්ති කර්ම ලෙස නියම කරනු ලැබේ. නමුත් බෝධි පූජාවක් තැබීමෙන්, දෙවියකුට බාරයක් වීමෙන් හෝ යන්ත්‍රයක් දැමූ පමණින් ඔබගේ අපලය හෙවත් අකුසලය සහමුලින් දුරුවී යන්නේ නැත. එහෙයින් අපල හෙවත් පූර්ව අකුසල් පවතී නම් එම අකුසලයට ප්‍රතිවිරුද්ධ කුසල් නිතර රැස්කළ යුතු වේ.

මෙය උදාහරණයකින් දැක්වීම තේරුම් ගැනීමට වඩා පහසු වනු ඇත. පෙර සඳහන් කළ පරිදි සිකුරු දුර්වල වීම නිසා විවාහය, ප්‍රේමය, ලෞකික සැප විඳීම යන අංශවල ගැටලු මතුවේ. මෙම දුර්විපාකය ඇතිවීමට බලපාන පූර්ව අකුසල් වන කාමයේ වරදවා හැසිරීම, කලත්‍රයාට පීඩා කිරීම, පවුල් ජීවිත කඩාකප්පල් කිරීම වැනි ක්‍රියාවන් පුද්ගලයාගෙන් පෙර සිදුවී තිබේ. මෙම අකුසල කර්මයන් දුරු කිරීම සඳහා දුප්පත් අසරණ පවුල් වෙත උපකාර කිරීම, පන්සිල් රැකීම, සැමියා හෝ බිරියට හොඳින් සැලකීම, අනුන්ගේ දියුණුවට, සැපතට උදව් කිරීම වැනි සත් ක්‍රියා මගින් කුසල් සම්පාදනය කළ යුතු වේ. මෙම කුමන කුසලය හෝ ශාන්ති කර්මය වුවද දින හතක් හෝ නවයක් කිරීම ප්‍රමාණවත් නැත.

ඔබ කරන එක් අකුසල ක්‍රියාවක රුදු විපාක ආත්ම ගණනක් ගෙවීමට සිදුවේ. සංසාර ගමන ඉතා කටුක යැයි බුදුරදුන් ප්‍රකාශ කර ඇත්තේ එහෙයිනි. අවශ්‍ය කුසල්වල නිතර නිතර යෙදීමෙන් කාලයත් සමග අකුසලය දුරු වී යයි. පව් ගෙවන්නට කෙටි මාර්ග නොමැත. මීට අමතරව ඔබගේ පැවැත්මද සුදුසු පරිදි සකසා ගත යුතුය. එනම් කාමයේ වරදවා හැසිරීම කිසිසේත් නොකළ යුතුය. බිරියට හෝ සැමියාට නිසි ගරු සම්මන හා අවංක ආදරය දැක්විය යුතුවේ. අණවින කොඩිවින, වශී ගුරුකම්වලින් ඈත්විය යුතු අතර අනුන්ගේ දියුණුවට බාධා නොවන අයුරින් හැසිරිය යුතුය. මෙසේ පුද්ගලයාගේ හැසිරීම වෙනස් වී යහපත් ජීවන රටාවක් හා අවශ්‍ය කුසල් යන කරුණු දෙක මිශ්‍ර වූ විට ග්‍රහ අපලවල අයහපත් විපාක දුරුවී යයි. මෙසේ ග්‍රහ අපල හරි හැටි හඳුනාගෙන ඊට සුදුසු ක්‍රියාමාර්ග හා ශාන්තිකර්මවල යෙදීමෙන් ක්‍රමානුකූලව අයහපත් විපාක පලවා හැරිය හැකි වේ. කුමන ග්‍රහ අපලයක් පැමිණියත් පන්සිල් රකින, නිතර පින් කරන පුද්ගලයාට හානි පැමිණීම ඉතා අඩුය.



**අනුරාධ පෙරේරා**


"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති - අපණ්ණක ජාතකය"

# වෙඬරුවේ උපාලි නාහිමිපාණෝ පැවිදි දිවියට පත්වී පණස් වසරයි

## දිගාසිරි පැතීමේ සහ සේවය අගය කිරීමේ උත්සවයක්

'ඓතිහාසික පොලොන්නරුව සොළොස්මස්ථානයේ පුරාවිද්‍යාත්මක පසුබිම ආරක්ෂා කරමින් එම පූජනීය වස්තූන් බෞද්ධ පින්වතුන්ට වර්තමානයේදී දැකබලා වන්දනාමාන කිරීමට සුදුසු පුණ්‍ය භූමියක තත්ත්වයකට පත්කිරීමට සොළොස්මස්ථානාධිපති අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක වෙඬරුවේ උපාලි හිමිපාණන් ගෙන ඇති පියවර ගිහි පැවිදි පිරිසගේ ප්‍රසාදයට ලක්වී ඇති බව මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක, නියංගොඩ විජිතසිරි නාහිමියෝ අස්ගිරිය ඓතිහාසික ගෙඩිගේ රාජ මහ විහාරයේ පැවැති උත්සවයකදී ප්‍රකාශ කළහ.

අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක ආදාහන මලුව ගෙඩිගේ රාජමහ විහාරාධිකාරී (දළදා ගමන් මාලිගාව) පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති වෙඬරුවේ උපාලි නාහිම්පාණන් පැවිදි දිවියට පත්වී පණස් වසරක් පිරීම නිමිත්තෙන් උපාලි අනුනායක හිමිපාණන්ට දිගාසිරි ප්‍රාර්ථනා කිරීම් වස් මෙම ආගමික උත්සවය දිවයිනේ සම්භාවනීය මහා සංඝ රත්නයේ



සහභාගිත්වයෙන් අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක වරකාගොඩ ශ්‍රී ඤාණරතන මාහිමිගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

එහිදී විජිතසිරි අනානුයක හිමියෝ මෙසේ ද පැවැසූහ.


"ශ්‍රී දළදා මාලිගාව ප්‍රධාන ඓතිහාසික ගෙඩිගේ රාජමහ විහාරය, අස්ගිරිය මහා විහාරය සම්බන්ධ අදාළ පුද සිරිත් චාරිත්‍ර පිළිබඳ සාම්ප්‍රදායික දැනුමක් ඇති ධර්මධර, විනයධර සුපේෂල තෙරනමක් වශයෙන් කටයුතු කරන උපාලි අනුනායක හිමිපාණන් දෙස් විදෙස්හි බෞද්ධ පිරිසගේ ගෞරවයට පාත්‍ර වූ අස්ගිරි මහා විහාරයේ කාරක මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ හිමිනමක්. අප මල්වතු මහා විහාරය සමග ශාසනික, ජාතික, ආගමික සේවාවන්හි සම්බන්ධව කටයුතු කරන උපාලි අනුනායක හිමිපාණන්ට තව තවත් ශාසනික සේවාවන්හි නිරත වීමට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා."

අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ මහා නායක අති පූජ්‍ය අති ගෞරවාර්හ වරකාගොඩ ශ්‍රී ඤාණරතන මහානාහිමි සහ කෝට්ටේ පාර්ශ්වයේ මහානායක අතිපූජ්‍ය ඉත්තෑපාන ධම්මාලංකාර මහානාහිමි, මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක දිඹුල්කුඹුරේ විමලධම්ම අනුනාහිමි යන නාහිමිවරුද උපාලි අනුනයක හිමිපාණන්ට ආසිරි පැතූහ.

උපාලි අනුනායක හිමිට ආසිරි පතා සිය ශිෂ්‍ය පිරිස විසින් සංස්කරණය කළ "ගල් පිළිමය" මැයින් (හිත් පිත් නැති පොළොවක හිත් පිත් ලද රූපකාය) ප්‍රබන්ධ කෘතියක්ද මෙහිදී එළිදැක්විණි.

**කේ. බණ්ඩාරනායක**

# අමුණුපුර පියරතන නාහිමියෝ උපසම්පදා වී 50 වසර සපුරති



මහනුවර අස්ගිරිය මහා විහාරයීය, විජයසුන්දරාරාම පුරාණ විහාරයීය, ශ්‍රී සද්ධම්මවර්ධන දහම් පාසලේ ප්‍රධානාචාර්ය, මහෝපාධ්‍ය ත්‍රිපිටකචාර්ය, විනයකීර්ති ශ්‍රී සුමංගලාභිධාන ශාස්ත්‍රවේදී පණ්ඩිත අමුණුපුර පියරතන නාහිමි උපසම්පදාවෙන් පණස් වසර (50) පිරීම නිමිතෙන් මැයි 6, 7 දිනවල ආගමික පින්කම් මාලාවක් විජයසුන්දරාරාමයේදී පැවැත්විණි.

අස්ගිරිය මහා විහාරය කේන්ද්‍රස්ථානය කරගෙන අඩසිය වසරකට ආසන්න කාලයක් ධර්ම ශාස්ත්‍රීය සේවාවක්, ධර්ම ග්‍රන්ථ සංස්කාරක පඬිරුවනක් වශයෙන් ඉටුකරන පියරතන නාහිමියෝ අස්ගිරිය ශ්‍රී විජයසුන්දරාරාම ශ්‍රී සද්ධර්මවර්ධන දහම් පාසලේ ප්‍රධානාචාර්ය වශයෙන් දශක හතරක් තිස්සේ දහම් අධ්‍යාපන සේවයක්ද ඉටු කරති.

**කේ. බණ්ඩාරනායක**

"අධික ලෝභයෙන් යුතුව යුක්තියට පිටුපාන අය වැනසෙති - සේරිවාණිජ ජාතකය"



# පතිදම් රැකීමේ අනුහස් කියැවෙන චුල්ල ධනුධර ජාතකය

ලෝක සත්වයා සසර කතරින් එතෙර කළා වූ සමන්ත චක්‍ෂු වූ අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා ස්ත්‍රියක් කෙරෙහි උකටලීව විසූ භික්ෂූන් වහන්සේ නමක් අරභයා මෙම ජාතක කතාව දේශනා කළ සේක.

ඒ භික්ෂූන් වහන්සේ එක් ස්ත්‍රියක් කෙරෙහි ලෝභ සිතින් උකටලීව වාසය කරන බව දත් බුදුන් වහන්සේ, ඒ මහණුන් වහන්සේ අමතා

"වැඩිහිටියන්ට අකීකරු වීම විපතට හේතුවේ - ඉන්දගුත්ත ජාතකය"





ඔබ ස්ත්‍රියක් කෙරෙහි ලෝභයෙන් වාසය කරන්නේ වේදැයි විචාළ කල්හි, එසේය ස්වාමීනි'යි සැල කර සිටියහ. එකල්හි ඔබ ස්ත්‍රීන් කෙරෙහි ලෝභ වූයේ දැන් මතු නොවෙයි, මින් පෙර භවයේත් එසේම වී සිටියේ නොවේදැයි වදාළ සේක. එවිට අනෙක් භික්ෂූන් වහන්සේලා ඒ ඉකුත්වත් කෙසේ දැයි විචාළ කල්හි. බුදුන් වහන්සේ මෙසේ වදාළ සේක.

යටගිය දවස බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන සමයෙහි, ගන්ධාර දේශයෙහි තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන් සමීපයට එක්තරා බ්‍රාහ්මණ කුමාරයෙකු ගොස් ශිල්ප ඉගෙන, දුනු ශිල්පය හදාරා නිමවූ කල්හි, ඒ කුමාරයාට චුල්ල ධනුර්ධර කුමාරයා යැයි නම් තබා තම වැඩිහිටි දියණිය ඔහුට පාවා දෙන ලදී. ඒ චුල්ල ධනුර්ධර කුමාරයා පාවා ගත් ස්වකීය බිරිඳ කැඳවාගෙන එක්තරා වනගත පෙදෙසකට පැමිණියහ.

ඒ වනයෙහි, මද ගලන ඇතෙකු ධනුර්ධරයන් දැක දිවගෙන ආවේය. එය දුටු චුල්ල ධනුර්ධරයා පංචායුධය සමග ඊදඬු පන්සියයකුත් රැගෙන ගිය බැවින් හස්තියා දිවගෙන එද්දී ඒ ඊතලය ඇඳ ඇතාගේ කුම්බස්තලය මැදට පතිතවන සේ විදිනු ලැබ ඇතා එතනම මැරී වැටුණාහ. ඉන් අනතුරුව වනාන්තරයෙහි ඉදිරියට යන විට සොරුන් පන්සියයක් දඩමස් මරා, පුලුස්සා කනු දැක, චුල්ල ධනුර්ධරයා තම බිරිඳ අමතා, දඩ මස් පුලුස්සා කන තැනැත්තන්ගෙන් දඩ මස් ඉල්ලාගෙන එන්නැයි කියා තම බිරිඳ යැවීය. එකී සොරුන් පිළිස්සූ දඩ මස් නොදී අමු මස් යැවූහ. චුල්ල ධනුර්ධර කුමාරයා තම බිරිඳ අමු මස් රැගෙන එනු දැක, ඒ අමු මස් ආපසු හරවා යවා පිළිස්සූ මස්ම ඉල්ලාගෙන එන්නැයි කීවේය. එවිට ඒ සොරු පන්සියයෙන් එක්කෙනෙක් කෝපයට පත්ව අප වෙහෙසවන්නේ දැයි කියා ධනුර්ධර කරා ගිය විට, පන්සියයට එක් ඊතලයක් බැගින් විඳ එක් එක්කෙනා මරා දැමූහ. ඉන් බේරුණු නායක සොරා චුල්ල ධනුර්ධර අල්ලා ගත්තේය. එවිට චුල්ල ධනුර්ධර තම බිරිඳ අමතා සොඳුර කඩුව දෙන්නැයි ඉල්ලා සිටියේය. එහිදී බිරිඳ සොරාට කඩුව දී තම සැමියාට කොපුව දුන්නාය.

සොරා ධනුර්ධරගේ ඉස කපා මරා ඒ ස්ත්‍රිය සමග නික්මී යන විට ගඟක් සමීපයට පැමිණ මෙසේ සිතුවේය. බාල කාලයෙහි පටන් පුරුදු තම පුරුෂයා මරවා, මා කෙරෙහි ලෝභ කළ මෙම තැනැත්තිය ඉදිරියේ දී අනෙක් පුරුෂයෙකු දුටුවත්

මගෙන් ප්‍රයෝජන නැතැයි සිතා, මා ද මරවන්නේ මෙසේ යැයි දැන, ඒ ස්ත්‍රිය අමතා, සොඳුර, තොප ඉණකඩ මුදා, පැළඳ සිටින ආභරණ ගලවා එහි බැඳ දෙන්න. එවිට ඒ ස්ත්‍රිය, පැළඳ සිටි ආභරණ ගලවා, තම ඉණකඩෙහි ඔතා සොර දෙටුවාට දුන්නාය. දෙදෙනා ගඟට වන් කල්හි ඇය, ස්වාමීනි, මා හැර පියා නික්මෙන්නේ දැයි සොර දෙටුවාගෙන් විමසුවාය. තොපගේ පරණ සැමියාට කළ දේ මට ද කරතැයි සිතෙන බැවින් තිගෙන් ප්‍රයෝජන නැතැයි කියා ඔහු තනිව නික්මී ගියේය. එතැන් සිට ඒ ස්ත්‍රිය ගඟ සමීපයේ බැද්දේ විසුවාය.



සක්දෙව් රජු මෙපවත් දැන පඤ්චසිඛයා හා මාතලී පුත්‍රයා කැඳවා, අසවල් ගඟ සමීපයේ ඉන්නා වූ ස්ත්‍රිය වෙහෙසන්ට උවමනායැයි කියා පඤ්චසිඛයාට උකුසු වෙස් ගන්වා, මාතලී දිව්‍ය පුත්‍රයා මත්ස්‍ය වෙස් ගන්වා, ශක්‍රයා කැණහිලි වෙසක් මවාගෙන, කටින් දඩ මස් කැටියක් අල්වාගෙන, මම ගඟ සමීපයේ වෙරළ අසලට යමි. පඤ්චසිඛය, තොප උකුසු වේෂයෙන් ආකාශයේ යන්න. මාතලීය, තොප මත්ස්‍ය වේෂයෙන් දියෙන් ගොඩට පැනූ විට මගේ කටෙහි තිබූ මාංශ කැබැල්ල දමා මත්ස්‍යයා ඩැහැ ගන්නට යමි. පඤ්චසිඛය, තොප උකුසු වේෂයෙන් මා දැමූ මස් කැබැල්ල ඩැහැ ගන්න. මාතලීය, තොප මත්ස්‍ය වේෂයෙන් දියට පනින්නැයි කතිකා කොට, තුන්දෙනා ඒ ස්ත්‍රිය සමීපයේ පෙනී සිටියහ.

කැණහිලා මාංශ කැටියක් කටින් ඩැහැ ගෙන ගඟ සමීපයේ යන අතර, මත්ස්‍යයෙක් දියෙන් ගොඩට පැනූ විට, කට තිබූ මාංශ දමා මත්ස්‍යයා ඩැහැ ගන්නට දිවූ කල මත්ස්‍යයා දියට පැන්නේය. උකුස්සා මාංශ කැටිය ඩැහැ ගත්තේය. ඒ කියන සිඟාලයා මත්ස්‍යයාත් නොලැබ, මාංශ කැටියත් නොලැබ වික්ෂෝපව ගඟ සමීපයේ උන් ස්ත්‍රියගේ මුහුණ බලා සිටියේය. එවිට ඒ කියන ස්ත්‍රිය මහත් සේ සිනාසුනාය.

එවිට ශක්‍රයා, මෙතන නැටීමක් හෝ ගී කීමක් හෝ කෙළි නළුවක් හෝ නැතිව, අස්ථානයේ සිනාසුනේ ඇයිදැයි ස්ත්‍රියගෙන් විචාළේය. එවිට ස්ත්‍රිය කියන්නේ, තොප කටින් ඩැහැගෙන ආ මාංශ කැටිය, මත්ස්‍යයා කම්යි කටින් දමා, මත්ස්‍යයා ඩැහැ ගන්නට ගිය කලට මාංශ කැටිය උකුස්සා ඩැහැ ගත්තේය. මත්ස්‍යයා දියට පැන්නේය. මේ කාරණය දැක සිනාසුනෙමියි කීවාය. එවිට ශක්‍රයෝ, තොප මට සිනාසෙන්නට කාරණා කිමද? තොපගේ පළමු ස්වාමියාත්, ඔහු අතහැර ලැබූ දෙවැනි ස්වාමියාත් නැතිව තනිව සිටින තොප, මට නින්දා කියා සිනාසෙන්නේයැයි ශක්‍රයා නින්දා කොට විචාළහ. එවිට ස්ත්‍රිය කියන්නී, පළමු මෙසේ කටයුතු කොට මෙවන් දුකකට පැමිණියෙමි. ඉන් ඉක්බිති පතිව්‍රතා ධර්මය රකිනු විනා, මෙබඳු දෙයක් නොකරමියි කීවාය. ශක්‍රයෝත් පතිව්‍රතා ධර්මය විනා මෙසේ නොකටයුතු දේ නොකරන්නැයි අවවාද කොට දෙව්ලොවට ගියහ.


මෙසේ අතීත කතාව ගෙන හැර දක්වා චුල්ල ධනුර්ධර ජාතකය නිමවා, චතුස්සත්‍ය දේශනාව වදාළ කල්හි, උකටලීව සිටි භික්ෂූන් වහන්සේ ඒ දහම් අසා සෝවාන් වූහ. එසමයෙහි චුල්ල ධනුර්ධර නම් මේ භික්ෂුවයි. ස්ත්‍රිය නම් මේ ස්ත්‍රියමයි. එකල ශක්‍රයාව උපන්නේ බුදුවූ මම'යැයි වදාරා චුල්ල ධනුර්ධර ජාතක කතාව නිමවා වදාළ සේක. මෙම ජාතක කතාවෙන් හෙළිවන චුල්ල ධනුර්ධරගේ බිරිඳට වූ විපාකය දැන පතිදම් රැකීමට ඔබ සැම ද අදිටන් කර ගත යුතුව ඇත.

**කේ. මීගහකුඹුර**


''මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක.''

United Nations Day of
VESAK
2561 B.E./2017 SRI LANKA

# ඉපදීම දුකක් වන්නේ කොහොමද?



රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
තලල්ලේ චන්දකිත්ති හිමි



සාමාන්‍ය ලෝකයේ ජීවත් වන අපට බොහෝ විට ඉපදීම දුකක් ලෙස සිතෙන්නේ නැහැ. නමුත් තථාගතයන් වහන්සේ වදාළේ ඉපදීම දුකක් ලෙසයි. එනිසා ඉපදීම දුකක් වන්නේ කෙසේද කියා අප සාකච්ඡා කළා.

❒ ස්වාමීන් වහන්ස, මිනිස් ආත්මය ලැබීම සුගතියේ ඉපදීමක්. එසේ නම් ඉපදීම දුකක් වන්නේ කොහොමද?

මිනිස් ලොව ඉපදීම සුගතියේ ඉපදීමක් බව ඇත්තයි. සුගතියේ ඉපදුණාන් සසරට ආවේණික දේවල් තමයි ඉපදීම කියන්නේ. අප දන්නවා දිව්‍ය ලෝක, මනුස්ස ලෝකවල සැප තිබෙනවා. නමුත් සසරට ආවේණික දුක් තිබෙනවා නම් ඒ දුකට මුහුණ දෙන්න වෙනවාමයි. ආවේණික දුක් කියන්නේ ගින්දර ළඟට ගියාම රස්නෙයි. අව්වේ ගියාම දාඩිය දානවා. ඒ වගේ ආවේණික දුක් තිබෙනවා. එනිසා ඉපදුණා නම් ජාති, ජරා, මරණ ව්‍යාධිවලට මුහුණ දීමට සිදුවෙනවා. ඒක ආවේණික දුකක්. ඒ නිසා මේ ලෝකයට ඉපදුණ කවුරුවත් ආවේණික දුකෙන් මිදිලා නැහැ. දිව්‍ය ලෝකයෙහි ඉන්න අයට පවා ඒ ආවේණික දුක තිබෙනවා. මිනිස් ලොව අපි ඉපදුණාට පස්සේ සැප විඳින බව ඇත්තයි. සුගතිය ලෙස හඳුන්වන දිව්‍ය ලෝකයත්, මනුස්ස ලෝකයත් ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මිදිලා නැහැ. දිව්‍ය ලෝක, මනුස්ස ලෝකවලත් මේ ආවේණික දුක තිබෙනවා. එනිසයි මොන භවයක පහළවීමක් වුවත් බුදුරජාණන් වහන්සේ දුකක් ලෙස හැඳින්වූයේ.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."



බුදුරජාණන් වහන්සේගේ මූලික දේශනා අපට කැටිකර ගන්න පුළුවන් චතුරාර්ය සත්‍ය ලෙස. චතුරාර්ය සත්‍ය ඉගැන්වීමේදී ආර්ය සත්‍ය හතරක් තිබෙනවා. දුක්ඛ සත්‍ය, සමුදය සත්‍ය, නිරෝධ සත්‍ය, මාර්ග සත්‍ය කියලා. ධම්මචක්ක සූත්‍රය, සච්ච විභංග සූත්‍රය වැනි සූත්‍ර මේ චතුරාර්ය සත්‍ය පිළිබඳව විස්තර කරලා දී තිබෙනවා. එතකොට දුක්ඛ සත්‍යය විස්තර කරද්දී උන්වහන්සේ වදාළා ජාතිපි දුක්කා කියලා. ඉපදීමක් දුකක් කියලා. උන්වහන්සේ ඉපදීම දුකක් කියලා දේශනා කළේ කුමක් නිසාද? 'ඉපදීම' කියන දේ හඳුන්වන තැනදී විශේෂයෙන්ම සඳහන් වන වචනයක් තිබෙනවා 'කන්ධානං ජාතිභානෝ' ස්කන්ධ පංචකය පහළවීම. ස්කන්ධ පංචකය කියන්නේ පංචස්කන්ධයයි. පංචස්කන්ධය තමයි රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන ගොඩවල් පහ යම් තැනක එකතු වෙලා තියෙනවා නම් එතැන තමා සත්ත්වයෙක් ඉන්නේ. සත්ත්වයකුගේ පහළවීමක් තිබෙන්නේ. සත්ත්වයා පහළවෙනවා කියන්නේ සත්ත්වයා ඉපදෙනවා කියන එකයි. ඉපදෙනවා කියන්නේ ජාති කියලා. එහෙනම් බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය විස්තර කිරීමේදී කියා තිබෙනවා 'පංචුපාදානස්කන්ධා දුක්ඛා' කියලා. ඒ කියන්නේ පංච උපාධානස්කන්ධයම දුකයි කියලා. පංච උපාදානස්කන්ධයම දුකයි නම් එය පහළවීමම දුකයි. ඒකයි ඉපදීම දුකයි කියලා කියන්නේ.

ඉපදීම දුකක් කියන්නේ ඇයි? අප දන්නවා ඉපදෙන කවුරුත් සතුටින් බිහිවන්නේ නැහැ. ඉපදෙන වෙලාවට ළමයත් අඬනවා, අම්මත් අඬනවා. උපදින වෙලාවෙත් වෙන්නේ වෙනස් වීමක්. එතැන දුක්ඛ වේදනාවක් තිබෙනවා. ටික වෙලාවකින් ඒ දුක ඒ අම්මට සුඛ වේදනාවක් වෙනවා. ඒ වේදනාව ඒ මැණියෝ ග්‍රහණය කළ ආකාරයට තමයි එහෙම වෙන්නේ.

අනෙක් කරුණ ඉපදීමට පෙර අප මවු කුසක මාස හත අටක් ඉන්නවා. මව් කුස කියන්නේ බොහොම පිරිසිදු නිර්මල තැනක් නොවේ. ලේවලින්, සැරවවලින් පිරුණු තැනක්. එහෙම තැනක කිසිම කෙනෙක් සතුටින් නොවී ඉන්නේ. එහෙම නම් මවුකුසක පිළිසිඳ ගත් මොහොතේ ඉඳලා ඒ දරුවා දුකෙන්, පීඩාවෙන්, අමාරුවෙන්, අපහසුවෙන් ඉන්නේ. මේ භවයේ දුකේ ආරම්භය එතැනයි. ඉපදුණ නිසා තමයි වයසට යන්නේ. ලෙඩ වෙන්නේ. මැරෙන්නේ. මේ සියලුම දුක් ලැබෙන්නේ එහෙම බැලුවාම ඉපදීමත් දුකක් කියන්න පුළුවන්.

❒ 'ඉපදීම' අවබෝධ කරගත යුතු දුකක්ද?

ඇත්තටම ඔව්. ඉපදීම දුකක් කියලා අවබෝධ කරගත්තා නම් නැවත ඒ දුකට වැටෙන්නේ නැහැ. 'ඉපදීම' නිසයි මේ හැම දේම කියලා යම් කෙනෙක් තේරුම් ගත්තොත් නැවත උපතක් පිණිස කරුණු සකස් වන්නේ නැහැ. ඒ නිසයි ඉපදීම දුකක් ලෙස අවබෝධ කරගත යුතු වන්නේ.

අපි බොහෝ දෙනකුට ඉපදීම දුකක් ලෙස අවබෝධ වන්නේ නැහැ. ඉපදෙන කොටම අනේ මේ දුක් ගොඩක්නේ පහළ වුණේ කියලා දන්නවා නම්, සංසාර ගමන නැවැත්තුවේ නැත්නම් මේ උපත යළි යළි සිදුවෙනවා කියලා දැනගත්තේ නැත්නම් ඉපදෙන්නට අවශ්‍ය කරන කරුණු රැස්වෙනවා. ඒ නිසා ඉපදීම දුකක් කියලා දන්නේ නැති පුද්ගලයා ඉපදෙන්නට ආසයි. ඉපදීම දුකක් කියලා හිතන්නේ නැති

''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදි පුබුදිත්.''

පුද්ගලයා ඉපදීම සැපත් කියා හිතනවා. ඒ සැපය වෙනුවෙන් නැවත නැවත ඉපදෙන්නට කර්ම රැස්කර ගන්නවා. එහෙම ඉපදීම තමයි දුකට මුල කියලා තථාගතයන් වහන්සේ වදාළා. බුදුරජාණන් වහන්සේ, රහතන් වහන්සේ ත්‍රිවිද්‍යාව පහළ කර ගෙන දකින්නේ ඉපදීමේ දුකයි. පුබ්බේනිවාසානුස්සති ඥානය ලබා ගැනීමෙන් පෙනෙනවා ඉපිද ඉපිද, මැරි මැරී ආ සංසාර ගමන. චුතූප්පපාත ඥානය කියන්නේ මැරිලා ගිහින් ඉපදෙන තැන. මැරිලා කොහේ යයිද කියලා දනගන්න පුළුවන්. එහෙම පුද්ගලයෙක් සංසාරයේ ගමන් කරන උපතක් ලබන්නට කැමැති වෙන්නේ නැහැ. ඒ නිසා ඒ ඉපදීම දුකක් කියලා දනගැනීම දුකෙන් මිදෙන්න අතිශයින්ම වැදගත්.

❒ **අප ලැබූ මිනිස් උපතින් ප්‍රයෝජන ගත යුතු ආකාරය පහදා දෙන්න.**


මනුස්ස ආත්ම භාවයක් ලැබීම ඉතාමත් වැදගත් දුර්ලභ කාරණයක් ලෙස තමයි ධර්මයේ සඳහන් වන්නේ. 'මනුස්ස ආත්ම භාවය' කියන්නේ නිකම්ම මිනිස් ආත්ම භාවයක් නොවේ. ඕනතරම් මිනිස්සු ඉන්නවා. නමුත් දුර්ලභ මිනිස් ආත්මය කියන එක ඊට වඩා වටින අර්ථයක් තිබෙනවා.

සරල සිද්ධියක් ලෙස ගත්තොත් ලෝකයේ ජීවත් වන අනෙකුත් සත්ත්වයන් හා සමාන කළොත් මිනිසුන් අඩුයි තමයි. දූන් අපි දන්නවා ලෝකයේ ජනගහණය ඉස්සරට වඩා ගොඩාක් වැඩියි. එහෙම නම් මිනිස් ජීවිතය දුර්ලභයි කියලා කියන්නේ කොහොමද කියලා අපටත් හිතෙන්න පුළුවන්. ඒත් අප දන්නේ නැහැ සත්ත්ව ලෝකවල කෝටි ප්‍රකෝටි ගාණක් සතුන් වැඩි වෙන්නේ කොහොමද කියලා. කුඹි ගුලක කුඹි කෙතරම් ප්‍රමාණයක් ඉන්නවාද? එහෙම බලපුවාම මිනිස්සු කියන්නේ බොහොම අල්ප ප්‍රමාණයක්.

බුදුරජාණන් වහන්සේ වදාළා නියම මනුස්ස ආත්මය පිළිබඳව. ඒ තමයි විකෘතිතාවක් නැති, මන්දබුද්ධික නොවී, කාටවත් අත නොපා ජීවත් වීමට තරම් ආර්ථිකයක් ශක්තියක් ඇති පිරිස. මේ කරුණු හතර සම්පූර්ණ වූ අය තමයි නියම මනුස්ස ආත්මයක් ලබන්නේ. ඒ පරමාර්ථයෙන් නියම මනුස්ස ජීවිතයක් ලබන එක ලෙහෙසි නැහැ. අන්ධ, ගොළු, බිහිරි, අංගවිකල නොවී ඉපදෙනවා කියන එක දුර්ලභ කරුණක්. ඒ වගේම හොඳ නරක වෙන් කරලා තේරුම් ගන්න පුළුවන්කමත් දුර්ලභයි. අපට ඒ භාග්‍යය ලැබිලා තිබෙනවා. ඒ නිසා එයින් ප්‍රයෝජනය අප ගන්නට ඕනෑ. ඒ වගේම අප බුද්ධෝත්පත්ති කාලයක ඉපදීමම කෙතරම් ලාභයක්ද?


ඒ නිසා ලැබුණු මිනිස් ජීවිතය ශක්තියක් කරගෙන ඉපදෙන, මැරෙන ලෝකයෙන් වෙන්වෙලා නැවත උපතක් කරා නොයාමට අපි සියලුම දෙනා අදිටන් කරගනිමු.

**සාකච්ඡා කළේ: නයනා නිල්මිණී**



''ධර්ම දානය සියලු දානයන්ට වඩා ශ්‍රේෂ්ඨයි.''

# කේ. මීගහකුඹුර මහතාගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව අගයා අස්ගිරි පාර්ශ්වයෙන් "ධර්ම සාහිත්‍යශූරී" ගෞරව නාමයක්



ශ්‍රී දළදා මාලිගාව, අස්ගිරි මල්වතු උභය මහා විහාරයන් මගින් පවත්වාගෙන යනු ලබන පැරණි චිරාගත සාම්ප්‍රදායික චාරිත්‍ර වාරිත්‍ර සම්බන්ධව පර්යේෂණාත්මක හා බහුශ්‍රැත දැනුමක් ඇතිව ශ්‍රී දළදා මාලිගාව, උභය මහා විහාරයන්හි වත් පිළිවෙත් සම්බන්ධව ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසක් මීගහකුඹුර මහතා විසින් සංස්කරණය කර ඇති බවත්, එතුමන්ගේ ධර්ම ශාස්ත්‍රීය සේවය අගය කරමින් උපහාරයක් ලෙස ගෞරව නාමයක් පිරිනැමීමට සංඝ සභාව තීරණය කළ බවත්, මහනුවර අස්ගිරිය මහා විහාරයීය මංගල උපෝසථාගාරයේදී පවත්වන ලද උත්සවයේදී අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවාර්හ වරකාගොඩ ධම්මසිද්ධි



ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන මහානායක මාහිමිපාණන් වහන්සේ ප්‍රකාශ කළහ.

ශ්‍රී දළදා මාලිගාවේ දේශීය බෞද්ධ කටයුතු කාර්යාංශයේ ලේකම් කේ. මීගහකුඹුර මහතා විසින් සිදුකරනු ලබන ධර්ම ශාස්ත්‍රීය සේවය අගයමින් අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභා සම්මතයෙන් "ධර්ම සාහිත්‍යශූරී" යන ගෞරව නාමය සහිත ශ්‍රී සන්නස් පත්‍රය මීගහකුඹුර මහතා වෙත පිරිනැමීම නිමිත්තෙන් මෙම උත්සවය සංවිධානය කර තිබුණි. අස්ගිරි මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරී ආචාර්ය මැදගම ධම්මානන්ද නාහිමි විසින් කියවන ලද ගෞරව නාම සන්නස් පත්‍රය පළමුවෙන් අස්ගිරි පාර්ශ්වයේ අතිපූජ්‍ය මහනායක මාහිපාණන් විසින්ද, පිළිවෙලින් මල්වතු මහා විහාර පාර්ශ්වයේ අතිපූජ්‍ය දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර, විමලධම්ම, මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, සාහිත්‍ය චක්‍රවත්තී අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි අනුනාහිමි, අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අනුනායක පොලොන්නරුව සොළොස්මස්ථානාධිපති අස්ගිරිය ඓතිහාසික ගෙඩිගේ රාජමහ විහාරාධිකාරී ශාස්ත්‍රපති අතිපූජ්‍ය වේඬරුවේ උපාලි, අස්ගිරිය පාර්ශ්වයේ අනුනයක ශාස්ත්‍රපති අතිපූජ්‍ය ආණමඩුවේ ධම්මදස්සි නාහිමිපාණන් වහන්සේලා විසින් පිරිනමා, මීගහකුඹුර මහතා විසින් සිදුකරන ලබන ධර්ම ශාස්ත්‍රීය හා ශ්‍රී දළදා මාලිගාව, උභය මහා විහාරයීය ශාසනික සේවාවන් අගය කරමින් ආසිරි පැතුහ.

එහිදී ශාස්ත්‍රපති අතිපූජ්‍ය ආනමඩුවේ ශ්‍රී ධම්මදස්සි අස්ගිරිය අනුනායක හිමියෝ මෙසේ පැවැසූහ.

"එතුමා ධර්මරාජ විද්‍යාලය ඇතුළු ප්‍රධාන පාසල් කීපයක ගුරුවරයකු වශයෙන්, විදුහල්පතිවරයකු වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශිෂ්ට සේවාවක් ඉටුකළ අධ්‍යාපනික විශාරදයෙකි. අධ්‍යාපනික අංශයෙන් විශ්‍රාම ලබා ශ්‍රී දළදා මාලිගාවේ බෞද්ධ කටයුතු කාර්යයන් බාරව උභය මහා විහාරයන්හී සාම්ප්‍රදායික වත් පිළිවෙත් සම්බන්ධව තීක්ෂණ දැනුමක් ඇතිව සිදුකරන ශාසනික සේවාවත්, ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ සංස්කරණ කටයුතු පවත්වාගෙන යෑමටත් එතුමන්ට ඉදිරියටත් ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය ප්‍රාර්ථනා කරනවා."

මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක සාහිත්‍ය චක්‍රවර්ති අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි අනුනාහිමි:

"බෞද්ධ ග්‍රන්ථ රැසක කර්තෘවරයකු වන මීගහකුඹුර මහතා සංස්කරණය කරන ලද බෞද්ධ ග්‍රන්ථ අතර "ශ්‍රී දළදා මාලිගාව සහ උභය මහා විහාර චාරිත්‍ර විධි" යන බෞද්ධ පර්යේෂණ ග්‍රන්ථය මෙහිදී මගේ සිහියට නැගෙනවා. මීගහකුඹුර මහතාගෙන් ඉටුවූ වටිනා මෙහෙවරක් ලෙස එම ධර්ම ග්‍රන්ථය හැඳින්විය හැකියි" පැවසූහ.

අස්ගිරිය මහා විහාර පාර්ශ්වයෙහි අනුනායක පොලොන්නරුව සොළොස්මස්ථානාධිපති අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරාධිකාරී, ශාස්ත්‍රපති අතිපූජ්‍ය වේඬරුවේ උපාලි නාහිමි:

"මහනුවර ධර්මරාජ, වාරියපොල ශ්‍රී සුමංගල වැනි විද්‍යාලයන්හී සේවය කරමින් මහා සංඝයා වහන්සේලාගේ අනුශාසනා ගරු කරමින් සිදුකළ සේවයේ ප්‍රතිඵල අද ලැබී තිබෙනවා. උසස් බෞද්ධ ග්‍රන්ථ රැසක් සංස්කරණය කර බෞද්ධ සමාජයට යොමුකර ඒ තුළින් ශ්‍රී දළදා මාලිගාව, උභය මහා විහාර සම්ප්‍රදායන් සම්බන්ධව දැනුමක් සමාජයට ලබාදීමෙන් ඒ මහතා ලබාදී ඇති ධර්ම ශාස්ත්‍රීය සේවය ඉතා වැදගත්." යැයි ප්‍රකාශ කළහ.

මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක අතිපූජ්‍ය දඹුල්කුඹුරේ විමලධම්ම නාහිමි:

"කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර, බඹරැන්දේ සිරිසීවලී, කොටහේනේ පඤ්ඤාකිත්ති වැනි බහුශ්‍රැත පඬිවරුන්ගෙන් ධර්ම ශාස්ත්‍රය දැනුමක් මෙන්ම ධර්ම අධ්‍යාපනයත් ලබා මීගහකුඹුර මහතා අද සිදුකරන ධර්ම සේවය ඉතා වැදගත්" යැයි පැවසූහ.

අස්ගිරිය මහා විහාර කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරී, ශාස්ත්‍රපති මැදගම ධම්මානන්ද හිමි:

"කිසිම ඉල්ලීමක් ඉදිරිපත් නොකර තිබියදීයි අස්ගිරි සංඝ සභාව මෙවැනි ගෞරව නාමයක් මීගහකුඹුර මහතා වෙත පිරිනැමීමට තීරණය කළේ" යැයි දැන්වූහ.

ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල මහතා:

"දළදා වරුණ පත්‍රය වසර 12 ක් තිස්සේ උසස් නිර්මාණයක් ලෙස සකස් කර ගිහි පැවිදි සමාජය අතට පත්කිරීමට එතුමා විශාල වෙහෙසක්, සහයක් ලබාදෙනවා. ශ්‍රී දළදා මාලිගාවේ සමාජ සත්කාර සේවාවත්, සුබසාධන කටයුතු විධිමත්ව සංවිධානය කිරීමේත් උසස් ප්‍රතිඵල ලබාගැනීමෙන්ද, බෞද්ධ ග්‍රන්ථ දහතුනක් සංස්කරණය කිරීමෙන්ද සිදුකරන ලද ධර්ම ශාස්ත්‍රීය සේවයත්, පෙරහර සංදේශය සකස් කිරීමෙන් එතුමන් ලබාදෙන සේවයත් අප ඉතා ඉහළින් අගය කරනවා" යැයි පැවසීහ.


පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. එම්. ඩී. ආර්. හේරත් මහතා:

"මල්වතු අස්ගිරි උභය මහා විහාර ශ්‍රී දළදා මාලිගාව මුල්කරගත් සාම්ප්‍රදායික විධි චාරිත්‍ර පිළිබඳව ශාස්ත්‍රීය දැනුමක් ලෝක විශ්ව විද්‍යාල පද්ධතිය වෙනුවෙන් ඉංග්‍රීසි බසින් ග්‍රන්ථ මුල්කරගෙන ලබාදීමට බෙහෙවින් මීගහකුඹුර මහතාගේ කෘති උපකාරී වූවා. අපි එතුමන්ට තව තවත් ධර්ම ලේඛනයේ යෙදෙන්නට දිඝායුසිරි පැතිය යුතුමයි" ප්‍රකාශ කළේය.

කේ. මීගහකුඹුර මහතා ස්තුති ප්‍රකාශ කළ අතර මීගහකුඹුර මහතාට ආසිරි පැතීමට සම්භාවනීය ගිහි පැවිදි පිරිසක් ඓතිහාසික උපෝසථාගාරයට පැමිණ සිටියහ.

**කේ. බණ්ඩාරනායක**

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# ඔබත් දවසක මැරෙන කෙනෙක්

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ දේශනා කළ ධර්මය සමාජගත කරන විට පැහැදිලි කළ එක කරුණක් වන්නේ මරණය පිළිබඳවයි. මරණයෙහි අංශ දෙකක් දක්නට ලැබේ. පළමු කරුණ ලෙස තමන් සිතින් යම්කිසි සිතිවිල්ලක් සිතන විට ඒ සිතිවිල්ල සමාජගත කිරීමට පෙර ''මමත් මැරෙන කෙනෙක්ය'' යන හැඟීම ඇතිකර ගත යුතුයි. කටින් යම්කිසි ප්‍රකාශයක් කරන විට එම ප්‍රකාශය කිරීමට පෙර දැනගත යුතුය.

මමත් යම්කිසි දවසක මැරෙන කෙනෙක් යැයි කල්පනාවට ගත යුතුයි. කයින් කිසියම් වූ ක්‍රියාවක් කරන විට එම ක්‍රියාව කිරීමට පෙර ''මමත් යම් දවසක මැරෙන කෙනෙක්'' බව සිතිය යුතුයි. මරණය නිතර මෙනෙහි කළයුතු, සිහිපත් කළයුතු යහපත් දෙයක් බව බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබේ.

මෙහිදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලබන්නේ ඕනෑම පුද්ගලයකු ජීවිතයේ ඕනෑම අභියෝගයක් ජයග්‍රහණය කිරීමට ශක්තිය තිබෙන නමුත් ඒ සඳහා ගමන් කළ යුතු මාර්ගය සොයා ගැනීම පමණක් ඇතැම් විට ප්‍රමාද වන බවයි. ජයග්‍රහණය නොකළ හැකි අභියෝගය වන්නේ මරණයයි.

මරණයේදී කවුරුත් යටත් වේ. මට මරණය ඉක්මවා යාමට බැරි බව නිරන්තරයෙන්ම සිහිපත් කළ යුතුයි. මරණය ලෝකයේ කිසිම පුද්ගලයකුට ජයග්‍රහණය කළ නොහැකි කවුරුත් පරාජයට පත්වන කාරණාවක් බවද බුදු දහම පෙන්වා දෙනු ලැබේ.

දෙවන කරුණ නම් තවත් කෙනකුට මරණය පිළිබඳව පැහැදිලි නොකළ යුතු බව බුදුරජාණන් වහන්සේ දන්වා තිබීමයි. මරණයේ ගුණ වර්ණනා නොකළ යුතුය.

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැගී යන්නෙකු වැනිය"

උපසම්පදා භික්ෂූන් වහන්සේ නමක් යම්කිසි කෙනකුට මරණයේ ගුණ වර්ණනා කරලා මරණය හොඳයි කියන අදහසත්, එම අදහස පිළිගෙන මරණය හොඳයි යන අදහසින් එම පුද්ගලයා මරණයට පත්වුවහොත්, එම භික්ෂූන් වහන්සේ ප්‍රාණඝාත අකුසලයක් කළ කෙනෙක් බවට පත්වේ.

එපමණක් නොව එම භික්ෂූන් වහන්සේ මහණකමටත් නුසුදුසු බව වදාරා ඇත.

මරණාසන්න කෙනකු සමීපයෙහි කතා කරන අවස්ථාවක ඔහුගේ සිත සනසන අදහසින් ''ඔබ සමාජයට යහපත් වැඩ කරමින් යහපත්ව ජීවත් වූ අයෙක්. ජීවත් වෙලා ඉන්න කාලයේදී හොඳට හිටපු අයකු ලෙස ඔබ මළාට කමක් නැහැ'' යනුවෙන් කියූ විට එම පුද්ගලයා ඒ කතාව අසා සිත සනසාගෙන මරණයට පත්වුවහොත් ඒ මරණයේ ප්‍රාණඝාත අකුසලය එන්නේ එලෙස පැහැදිලි කරපු අයටමය.

මරණයේ ගුණ වැයීම පාරාජිකාවක් ලෙස බුදුරජාණන් වහන්සේ උපසම්පදා භික්ෂූන් වහන්සේට වදාරා ඇත. මරණය දෙස අංශ දෙකකින් බැලීමේ හැකියාව තිබේ. පළමු කරුණ ලෙස තමන් සිතින් කයින් වචනයෙන් කරන හැම ප්‍රකාශයකදීම, සිතිවිල්ලකදීම තමනුත් මැරෙණ කෙනෙක්ය, මරණයට මම යටත්ය, මට මරණය ඉක්මවා යා නොහැකි බව සිතන්න කල්පනා කරන්න. එය මරණුස්සති භාවනාව ලෙස බුදු දහමෙහි ඉගැන්වේ.

එසේ වදාරණ බුදුරජාණන් වහන්සේ මරණය පිළිබඳව දෙවන විග්‍රහයේදී තවත් කෙනකුට තමන්ගේ ලාභය, වාසිය පිණිස හෝ වෙනත් කෙනකුගේ සිතට මරණය හොඳයි කියන හැඟීමක් එන ලෙසට මරණය සැපයි කියන ලෙස මරණය පැහැදිලි නොකළ යුතුය. තමුන් දැන සිටීම භාවනාවක් වුවත් අනුන්ට එය පැහැදිලි කරදීම අකුසලයකි.

අනුවණ පුද්ගලයන්ට කේන්තියක් ආ විගස එය දරාගත නොහැකි වේ. තමන් කවුද යන බව හඳුනා ගැනීමට බැරි තරමටම එම කේන්තිය ප්‍රබලය. කේන්තිය, වෛරය, තරහව, වාද විවාද ගත් විට එය එතරම් ප්‍රබලය. තමන්ගේ තරාතිරම, තත්ත්වය තේරුම් ගත නොහැකිය.

තමන්ට නිවැරදිව කළ හැකි කාර්යය නොතේරේ. එවිට තමන්ගේ ශරීරය පුරාම රුධිරය ලෙස ගමන් කරන්නේ වෛරයයි. වෛරය, කේන්තිය පුද්ගලයාගේ මනසට පැමිණි විට එම පුද්ගලයාට මරණය නොපෙනේ. මම මැරෙන කෙනෙක්, මම මරණයට යටත් කෙනෙක් යන බව නොසිතේ. ඔහුට එන එකම සිතිවිල්ල නම් අනෙක් පුද්ගලයා සම්පූර්ණයෙන්ම විනාශ කළ යුතුය යන බවයි. එම පුද්ගලයාගේ චරිතය මැරිය යුතුය.

එසේ නැතහොත් ඔහුගේ මනස අකර්මණ්‍ය කළ යුතුය. නැතහොත් සිත අවුල් කළ යුතුයි ආදී වශයෙනි. ඔහුගේ දියුණුව වළක්වාලීමයි. සමාජය ඔහු පිළිබඳව කලු ලප තැබීමට උත්සාහ කරයි. එය වෛරී මනසේ ස්වභාවයයි.

''පරෙ ච න විජානන්ති
මය මෙත්ත යමා මසෙ
යේච තත්ථ විජානන්ති
තතො සම්මන්ති මේධගා''

බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලැබුයේ මරණය පිළිබඳ අවබෝධයක් සහිත පුද්ගලයා කළහ නොකරන බවයි. කළ යුතු දෙය පමණක් කරන බවයි. ආරවුලකට පළමුව මත ප්‍රකාශ කිරීමක් වේ.

එහිදී අනෙක් මත ඉවසා දරා ගැනීමට නොහැකි වූ විට තමන්ගේ මතය නිවැරදි බවත් අනෙකාගේ මතය වැරදි බවත් ප්‍රකාශ කරමින් ඔහු ආරවුලකට ගමන් කරයි. ලෝකයේ බොහෝ වැරදි දේ මෙන්ම බොහෝ නිවැරදි දේ තිබේ. ඒ ඒ අයගේ ඥාන ප්‍රමාණයන් අනුව ඒවා දකින ශක්තිය පමණක් වෙනස් වේ.

බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායේදී දේශනා කරන ලද්දේ යම් පිරිසක් කළහ කරනු ලබනවා නම් ඒ පිරිස සිටින දෙසවත් බැලීමට තථාගතයන් වහන්සේ අකමැති බවය.

බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍යය වනයට වැඩම කළ බවට ශාසන ඉතිහාසයේ සඳහන් වේ. බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍යය වනයට වැඩම කිරීමට මූලික වූ කාරණය වූයේ භික්ෂූන් වහන්සේලා අතර හටගත් ගැටුමයි. ගැටුමේ මූලික ආරම්භය ඇතිවන්නේ පුද්ගලයාගේ ඔළු කටුව තුළය.



අදහස හොඳින් සිතා නොබලා අවශ්‍ය, අනවශ්‍ය තැන තේරුම් නොගෙන, කිය යුතු, නොකිය යුතු පුද්ගලයා තේරුම් නොගෙන අදහස ප්‍රකාශ කිරීමෙන් පසුව තවත් අයකුට එය ගැටුමක් බවට පත්වේ. එය මිනිසාගේ දැනුම් තේරුම්කම අනුව ආරවුලක් බවට පත්වේ.

ආරවුලෙහි ස්වභාවය මානසික තත්ත්වයකි. මානසික තත්ත්වය කායික වශයෙන් පිරිමසා ගැනීමට යාමෙන් එම වෛරය පුද්ගලත්වයට ආරෝපණය කර ගනී. එම මානසික ගැටුම පුද්ගල ගැටුමක් බවට පත්වේ. එම ගැටුම නිවෙස් තුළ, නිවාස නිවාස අතර, ජාතීන් ජාතීන් අතර, රට රටවල් අතර විය හැකිවේ.

එම ගැටුමට පළමුව තමන් පිළිබඳව සිතිය යුතු බව බුදු දහම පෙන්වා දෙනු ලබයි. ''මම මරණයට යටත්ය. මම මැරෙන කෙනෙක්ය'' යනුවෙන් සිතා කෙනකුට මෙම ගැටලුව විසඳාගත හැකිවේ.

**මහාචාර්ය පාතේගම ඥාණිස්සර හිමි**